# සුහාසර්

中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

蓮花

沈鸣

**2017 - පලමුවන සහ දෙවන කලාප**



中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොවපුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

සුභාසර
蓮花


**චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය**

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2373/0439

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka



**අනුශාසකත්වය**

ජගත් අබේසිංහ

සුදත් මඩුගල්ල

**සංස්කාරක**

ශී යුයැ, සුන් ජ්යා ජ්යා

**කතෘ මඩුල්ල**

ශී යුයැ, ෂෞං ලී, ලියු හුයි,

හාඕ ලී ෆාං, වං යිං, හැන් ජ්යැන්,

සුන් ජ්යා ජ්යා, චෙන් ගුවැන් වන්,

රවිමල් හඳුවල, සුගත් රත්නායක,

නිසංසලා රත්නායක

**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


# පටුන


| | |
|---|---|
| චීන ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සබඳතාව ස්ථාපිත වීමෙන් පසු සිදු වූ වැදගත් සිදුවීම් | 2 |
| චීන ශ්‍රී ලංකා රාජ්‍යතන්ත්‍රික සබඳතාවේ 60 වෙනි සැමරුමට දෙරටේ නායකයෝ සුබ පැතුම් පිරිනමති | 8 |
| ද්විපාර්ශ්වික ආර්ථික හා වෙළඳ සබඳතා | 11 |
| සංස්කෘතිය හා සංචාරය යනාදී ක්ෂේත්‍රවල ද්විපාර්ශ්වික සබඳතා | 16 |
| ශ්‍රී ලංකාවේ ගංවතුර සහ නාය යාම් විපත් පිළිබඳව චීනය දැක්වූ කඩිනම් සැලකිල්ල | 24 |
| ගෙවුණු හැට වසරක ශ්‍රී ලංකාවේ සංවර්ධනය | 30 |
| ධර්මය සොයා ගිය පාහියන් හිමියන් | 39 |
| ශ්‍රී ලංකාවේ අවලෝකිතේශ්වර පිළිමය තැන්පත් මාළිගය | 45 |
| ශ්‍රී ලංකා-චීන අලි මිතුදම | 49 |
| කොන්ෆියුසියස් මූලස්ථානය සහ චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය | 54 |
| මම සහ චීන භාෂාව | 66 |
| එදිනෙදා චීන බස | 68 |
| අසන්නන්ගේ බිත්ති පුවරුව | 70 |
| අන්නාසි සහිත කුකුල් මස් | 72 |
| මිරිස්වලින් සාදා ගන්නා සෝස් | 73 |
| ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන් | 74 |

# චීන ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සබඳතාව ස්ථාපිත වීමෙන් පසු සිදු වූ වැදගත් සිදුවීම්

චීනය හා ශ්‍රී ලංකාව අතර පවතින්නේ වසර 2000කට වැඩි දීර්ඝකාලීන සුහද සබඳතාවකි. දෙරට රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීමෙන් පසු වසර දස ගණනාවක් තුල එම මිතුදම තවදුරටත් තහවුරු කොට තිබේ.

**ද්විපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රික සබඳතා**

**1952** වසරේ චීනය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතාව ස්ථාපිත කිරීමටත් පෙරදීම ඇමරිකාව ඇතුළු බටහිර රටවල් චීනයට කළ බාධා නොතකා ලංකාව චීනය සමග රබර්-සහල් ගිවිසුමට අත්සන් තැබීය.



**1957** වසරේ පෙබරවාරි මස 5 වෙනිදා කොළඹදී ලංකාවේ සංචාරයක නිරත වූ එවක චීන අග්‍රාමාත්‍ය චෞ එන් ලායි මහතා සහ එවක ලංකා අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක මහතා ඒකාබද්ධ නිවේදනයකට අත්සන් තබා නිකුත් කළහ. එම සංචාරයට පසු පෙබරවාරි මස 7 වෙනිදා දෙරට රාජ්‍යතාන්ත්‍රික සබඳතාව නිළ වශයෙන් ස්ථාපිත කෙරිණ.



**1962** වසරේ දෙසැම්බර් මාසයේ අග භාගයේ සිට 1963 වසරේ ජනවාරි මාසයේ මුල් භාගය දක්වා කාලය තුල එවක ලංකා අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක මහත්මිය චීනයේ නිළ සංචාරයක නිරත වූවාය. ඇය එවක චීන අග්‍රාමාත්‍ය චෞ එන් ලායි මහතා සහ එවක චීන උප ජනාධිපති සොං චිං ලිං මහත්මිය හමු වූවා ය.





**1972** වසරේ ජූනි මාසයේ එවක චීන සභාපති මාඕ සේ තුං මහතා බෙයිජිංහි චීනයේ නිළ සංචාරයක නිරත වූ එවක ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය බණ්ඩාරනායක මහත්මිය හමු විය.

ශ්‍රී ලංකාවේ දරුවන් වෙනුවෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය බෙයිජිංහි දරුවන්ට මිතුරා නමින් කුඩා ඇතෙක් පරිත්‍යාග කළාය.





**1984** වසරේ මැයි මාසයේ එවක ශ්‍රී ලංකා ජනාධිපති ජයවර්ධන මහතා චීනයේ සංචාරය කළ අතර එවක චීන ජනාධිපති ලී සිඇන් නිඇන් මහතා බෙයිජිංහිදී හමු විය.



**1986** වසරේ මාර්තු මාසයේ ලී සිඇන් නිඇන් ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ නිළ සංචාරයක් සිදු කළේ ය.



**1988** වසරේ සැප්තැම්බර් මාසයේ එවක ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මහතා දෙවැනි වතාවට චීනයේ සංචාරය කළේ ය. මීට අමතරව, 1979 වසරේ අගෝස්තු මාසයේ නිරත වූ චීන නිළ සංචාරයේදී ද හෙතෙම එවක චීන කොමියුනිස්ට් පක්ෂ මධ්‍යම යුධ සභාපති ඩෙං සිඕ පිං මහතා හමු විය.



**2005** වසරේ අප්‍රේල් මාසයේ එවක චීන අග්‍රාමාත්‍ය වෙන් චිආ බෞ මහතා ලංකාවේ දෙදින නිළ සංචාරයක් කළේ ය. හෙතෙම එවක ශ්‍රී ලංකා ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය හමු විය. ශ්‍රී ලංකාවේ සංචාරයේ යෙදුනු වෙන් චිආ බෞ අග්‍රාමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ බටහිර ප්‍රදේශයේ පිහිටි දරුණු සුනාමි විපතට ලක් වූ පානදුර ධීවර වරායට ගොස් නිරීක්ෂණයක් කළේ ය.






**2007** වසරේ පෙබරවාරි මාසයේ එවක චීන ජනාධිපති හූ චින් තෞඕ මහතා බෙයිජිංහිදී එවක ශ්‍රී ලංකා ජනාධිපති ධූරයට අලුතින් තේරී පත් වූ මහින්ද රාජපක්ෂ මහතා හමු විය.





**2013** වසරේ මැයි මාසයේ එවක ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා යළි චීනයේ නිළ සංචාරයක නිරත වූ අවස්ථාවේදී ද්විපාර්ශ්වික සබඳතාව ක්‍රමෝපායීය සහයෝගතා හවුල්කාරී සබඳතාවක් දක්වා වර්ධනය කිරීමට දෙරට එකඟ විය.






**2014** වසරේ සැප්තැම්බර මාසයේ චීන ජනාධිපති ෂී ජින් පිං මහතා ශ්‍රී ලංකාවේ නිළ සංචාරයක් කළේ ය. එය 1986 වසරේ එවක චීන ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමෙන් පසු චීන ජනාධිපතිවරයෙකු ශ්‍රී ලංකාවේ කළ ප්‍රථම සංචාරයයි.



**2015** වසරේ මාර්තු මාසයේ ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා චීනයේ නිළ සංචාරයක් කරමින් චීන ජනාධිපති ෂී ජින් පිං මහතා සමඟ සාකච්ඡාවක් පැවැත්විය. චීන අග්‍රාමාත්‍ය ලී ක ෂ්‍යං මහතා ද ශ්‍රී ලංකා ජනාධිපතිවරයා හමු විය.















**2016** වසරේ අප්‍රේල් මාසයේ චීන ජනාධිපති ෂී චින් පිං මහතා බෙයිජිංහි මහජන මහ ශාලාවේදී චීනයේ නිළ සංචාරයක නිරත වූ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා හමු විය.












# චීන ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සබඳතාවේ 60 වෙනි සැමරුමට දෙරටේ නායකයෝ සුබ පැතුම් පිරිනමති

## චීන ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සබඳතාව ස්ථාපිත වී වසර 60 ක් සපිරීම නිමිත්තෙන් දෙරටේ ජනාධිපතිවරු අන්‍යෝන්‍ය වශයෙන් සුබ පැතුම් පිරිනමති.




චීන ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සබඳතාව ස්ථාපිත වී වසර 60 ක් සපිරීම නිමිත්තෙන් දෙරටේ ජනාධිපතිවරු අන්‍යෝන්‍ය වශයෙන් සුබ පැතුම් පිරිනැමූහ. චීන ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සබඳතාව ස්ථාපිත වීමේ වසර 60 තුළ, ජාත්‍යන්තර ප්‍රවණතාවන්හි වෙනස්කම් හමුවේ දෙරටේ සබඳතාවේ විධිමත් වර්ධනය තහවුරු කර ඇතැයි චීන ජනාධිපති ෂී චින් පිං මහතා තම සුභාශිංසන පණිවුඩයේ සඳහන් කළේය. චීන ශ්‍රී ලංකා සබඳතා ඉහළින් අගය කරන හෙතෙම එක් තීරයක් එක් මාවතක් යන යෝජනාවට ශ්‍රී ලංකාව සක්‍රීය ලෙස එක් වීම සම්බන්ධයෙන් ප්‍රශංසා පල කළේය. දේශපාලන අන්‍යෝන්‍ය විශ්වාසය ශක්තිමත් කරමින් අන්‍යෝන්‍ය යහපත් සහයෝගතා පුළුල් කොට සිවිල් මිත්‍රත්වය ගැඹුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සමඟ එක්ව දායක වීමට කැමැත්තෙන් පසු වන බව ෂී චින් පිං මහතා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා වෙත යොමු කළ සුබ පැතුම් පණිවුඩයේ දැක්විණ. අවංක හා අන්‍යෝන්‍ය සහය සහිත පාරම්පරික මිතුදමෙන් යුත් ක්‍රමෝපායීය හවුල්කාරී සබඳතාවේ නව ජීවයක් අපේක්ෂා කරන බව ද චීන ජනාධිපතවරයා පැවසීය.

ශ්‍රී ලංකා චීන මිතුදම අතීතයේ සිට පවතින සැබෑ මිත්‍රශීලි සබඳතාවක් බව මෛත්‍රීපාල සිරිසේන මහතා සුබ පැතුම් පණිවුඩයක් මඟින් සඳහන් කළේය. රාජ්‍යතාන්ත්‍රික සබඳතාව ස්ථාපිත වූ වසර 60 තුළ, තිරසර මෙන්ම විධිමත් ලෙස ශක්තිමත් වූ දෙරටේ සබඳතාව ක්‍රමෝපායීය හවුල්කාරී සබඳතාව දක්වා වර්ධනය වී ඇතැයි හෙතෙම කියා සිටී. එක් තීරයක් එක් මාවතක් යන යෝජනාව ඉපැරණි මුහුදු සේද මාවත පදනම් කර ගනමින් ශ්‍රී ලංකා චීන සහයෝගතාව වෙනුවෙන් නව යුගයක් නිර්මාණය කරනු ඇතැයි ශ්‍රී ලංකාව විශ්වාස කරයි. ශ්‍රී ලංකා චීන සබඳතාව නොකඩවා ම ඉදිරියට ගෙන යමින් එය තවදුරටත් ශක්තිමත් වේවායි ද මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රාර්ථනා කර සිටී.



## චීනය සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 60 වන සංවත්සරය සැමරීම නිමිත්තෙන් චීන සහ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරු එකිනෙකාට සුභපැතුම් පිරිනමති.




චීනය සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 60 වන සංවත්සරය සැමරීම සඳහා චීන අග්‍රාමාත්‍ය ලී ඛ ච්‍යාං මහතා හා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා එකිනෙකාට සුභපැතුම් පණිවුඩ පිරිනැමූහ.

1957 වසරේදී චීනය සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවීමෙන් පසුව, දෙරට අතර සබඳතා නොකඩවා ම විධිමත් ලෙස වර්ධනය වී ශක්තිමත් වී ඇති බව චීන අග්‍රාමාත්‍ය ලී ඛ ච්‍යාං මහතා සිය පණිවුඩය මඟින් පැවසීය.

එක් තීරයක් එක් මාවතක් වැඩපිළිවෙල සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීම මඟින් චීනය සහ ශ්‍රී ලංකාව අතර ඒ ඒ ක්ෂේත්‍රවල පවතින සහයෝගිතා ද වර්ධනය වී තිබේ. ඒ අනුව ද්විපාර්ශ්වික සබඳතාවේ දීප්තිමත් ඉදිරි දැක්මක් දක්නට ලැබෙන බව චීන අග්‍රාමාත්‍යවරයා පැවසීය. සාම්ප්‍රදායික මිතුදම තරකිරීම, අන්‍යෝන්‍ය ඵලදායි සහයෝගිතා නව තලයකට ගෙනඒම සහ චීන-ශ්‍රී ලංකා ක්‍රමෝපායීය සහයෝගිතා හවුල්කාරී සබඳතාව ඉදිරියට මෙහෙයැවීම සඳහා, ශ්‍රී ලංකාව සමඟ එක්ව කටයුතු කිරීම සම්බන්ධයෙන් චීනය කැමැත්තෙන් පසු වන බව ද ලී ඛ ච්‍යාං මහතා සිය සුභපැතුම් පණිවුඩයේ සඳහන් කළේය.

මේ අතර, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සිය සුභපැතුම් පණිවුඩය මඟින් පවසා ඇත්තේ ශ්‍රී ලංකාව සහ චීනය අතර මිත්‍රත්වය ගොඩ නැගුණේ පැරණි මුහුදු සේද මාවත තුළින් වන අතර, මෙම මිත්‍රත්වය වසර සීය ගණනාවක් තිස්සේ පවත්වා ගැනීමට රටවල් දෙකට හැකි වී ඇති බවයි.

චීනය ඉදිරිපත් කළ එක් තීරයක් එක් මාවතක් සංකල්පය ඇසුරින් ශ්‍රී ලංකාව සහ චීනය අතර මිතුදම තවදුරටත් වර්ධනය වනු ඇති අතර, දෙරට සහයෝගිතාවට ද එම සංකල්පය හේතුවෙන් නැවුම් අවස්ථා හිමි වනු ඇති බවට තමන් විශ්වාසයෙන් සිටින බව ද රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කර තිබේ.

ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් තහවුරු කිරීම, සහයෝගිතා ක්ෂේත්‍ර අඛණ්ඩව ව්‍යාප්ත කිරීම මෙන්ම, දෙරට ජනතාවට සුභසෙත සැලසීම සඳහා චීනය සමඟ පොදුවේ පියවර ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා සිය පණිවුඩය මඟින් වැඩිදුරටත් සඳහන් කර තිබේ.

## චීන ශ්‍රී ලංකා රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත වී වසර 60 ක් සපිරීම පිළිබඳව චීන ශ්‍රී ලංකා දෙරටේ විදේශ අමාත්‍යවරු අන්‍යෝන්‍ය ලෙස සුබ පැතුම් පිරිනමති.





චීන ශ්‍රී ලංකා රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත වී වසර 60 ක් සපිරීම පිළිබඳව චීන ශ්‍රී ලංකා දෙරටේ විදේශ අමාත්‍යවරු අන්‍යෝන්‍ය ලෙස සුබ පැතුම් පිරිනැමූහ. දිගු කාලීන මිත්‍ර සබඳතාවකට හිමිකම් කියන චීනය හා ශ්‍රී ලංකාව අතර රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත වී ගතවූ වසර 60 ක් තුළ අන්‍යෝන්‍ය ගරු කිරීම හා අනුබල දීම, සමානත්වය හා අන්‍යෝන්‍ය යහපත පදනම් කොට ගෙන සබඳතාව අඛණ්ඩව සංවර්ධනය කොට තිබෙන බව ශ්‍රී ලංකා විදේශ අමාත්‍යවරයාට සුබ පැතුම් පිරිනමමින් චීන විදේශ අමාත්‍ය වං යී මහතා පැවසීය.

චීන ශ්‍රී ලංකා දෙරට අවංක අන්‍යෝන්‍ය සහය දීමේ හා පාරම්පරික මිත්‍රත්ව උපායමාර්ගික සහයෝගතා හවුල්කාරී සබඳතාව අඛණ්ඩ ලෙස ඉදිරියට ගෙන යෑමට අපේක්ෂා කරන බව ද එම සුබ පැතුම් පණිවුඩයේ සඳහන් විය.

ගත වූ වසර 60 තුළ ශ්‍රී ලංකා චීන මිත්‍ර සබඳතාව මුල සිට ම අන්‍යෝන්‍ය ගරු කිරීම හා යහපත සහ සහයෝගතා පදනම් කොට ගෙන තිබෙන බව ශ්‍රී ලංකා විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා වං යී මහතාට සුබ පැතුම් පිරිනමමින් පැවසීය.

දෙරට සබඳතාව උපායමාර්ගික සහයෝගතා හවුල්කාරි සබඳතාවක් බවට පත් වී තිබෙන බව ඔහු අවධාරණය කළේය.

ශ්‍රී ලංකාව හා චීනය අතර සහ දෙරට ජනතා අතර මිතුදම දිගු කල් දිනේවා යැයි මංගල සමරවීර මහතා එම සුබ පැතුම් පණිවුඩයෙන් ප්‍රාර්ථනා කර සිටී.



# ද්විපාර්ශ්වික ආර්ථික හා වෙළඳ සබඳතා





1953 වසරේ සිට 1982 වසර දක්වා කාලය තුළ චීන-ශ්‍රී ලංකා වෙළඳාම වුනේ ගිණුම් පියවීම් වෙළඳාම් ක්‍රමයකි. 1983 වසරේ සිට චීන-ශ්‍රී ලංකා වෙළඳාම මුදල් ගෙවීම් වෙළඳාම් ක්‍රමයක් බවට පත්විය. 2016 වසරේ දෙරට ද්විපාර්ශ්වික වෙළඳ වටිනාකම ඇමරිකානු ඩොලර් කෝටි 456කි. ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ හවුල්කරුවා මෙන්ම ආනයන රට බවට චීනය පත් ව තිබේ.


චීනය 1957 වසරේ සිට ශ්‍රී ලංකාවට ආර්ථික හා තාක්ෂණික සහනාධාර ලබා දීම ආරම්භ කළේ ය. ඉන් පසු දෙරට සහයෝගතා පවත්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, ශ්‍රේෂ්ඨාධිකරණ ගොඩනැගිල්ල හා ජාතික සංදර්ශන කලා රඟහල යනාදි ව්‍යාපෘති රැසක් සම්පූර්ණ කර තිබේ. ඒවා චීන-ශ්‍රී ලංකා මිත්‍ර සංකේතයන් ලෙසට හැඳින්වෙයි.















2004 වසරේ අගදී ඉන්දීය සාගරයේ සුනාමි විපත සිදු වීමෙන් පසු චීන රජය ශ්‍රී ලංකාවට සුනාමි විපත් සහය ලබා දුන්නේ ය. චීනය ශ්‍රී ලංකාවේ කල් පිරුණු පැරණි ණය මුදල් කපා හැරියේ ය. එමෙන්ම චීන වෛද්‍ය සේවා කණ්ඩායම් රැසක් ශ්‍රී ලංකාවට ගොස් එහි සහන කටයුතුවලට එක් වූහ. චීන ජනතාවගේ පෞද්ගලික මුදල් එක්රැස් කොට ශ්‍රී ලංකාවේ විපතට ලක් වූ ජනතාවට චීන-ශ්‍රී ලංකා මිත්‍ර ගම්මාන හා චීන-ශ්‍රී ලංකා රතු කුරුස ගම්මානය ඉදි කළේ ය.















2008 වසරේ චීනයේ ස්චුවාන් පළාතේ වෙන් චුවාන් කෝරළයේ මහ භූ කම්පාවක් සිදු වීමෙන් පසු විවිධ ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකිකයෝ විපතට ලක් ප්‍රදේශයට නොපැකිලව මුදල් පරිත්‍යාග කළහ. ශ්‍රී ලංකා රජය චීනයට කූඩාරම් 1277ක් සහ ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 11ක වටිනා සහන ද්‍රව්‍ය පරිත්‍යාග කළේ ය.

2008 වසරේ එවක ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විපතට ලක් වූ චීනයේ ස්චුවාන් පළාතේ දු ච්‍යං යැන් ප්‍රදේශය නිරීක්ෂණය කළේ ය.














2009 වසරේ ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු චීනය ශ්‍රී ලංකවේ විශාලතම සහනාධාර සපයන රට වගේම විශාලතම විදේශ ආයෝජන මූලාශ්‍ර රට බවට පත් වී තිබේ. චීන ව්‍යාපාර රැසක් ශ්‍රී ලංකාවේ ආයෝජනය කර පශ්චාත් යුද සංවර්ධනයට සක්‍රීය ව එක් වී තිබේ. 2016 වසරේ අග භාගය වන විට, චීන ව්‍යාපාර ශ්‍රී ලංකාවේ සිදු කළ සමස්ත සෘජු ආයෝජන වටිනාකම් ඇමරිකානු ඩොලර් බිලියනයකට ළඟ වී තිබේ. කොළඹ කටුනායක අධි-වේගී මාර්ගය, දක්ෂිණ අධි-වේගී මාර්ගය, මත්තල ගුවන් තොටුපල, නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාරය, කොළඹ දකුණු වරායේ කන්ටේනර් පර්යන්තය, ඒ වගේම ඉදි කෙරෙමින් පවතින කොළඹ වරාය නගරය, පාලම්, මහ මාර්ග, සහ දුම්රිය මාර්ග පිළිබඳ ඉදි කිරීම්වලට චීන ව්‍යාපාර එක් ව තිබේ. චීනය ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත.












# සංස්කෘතිය හා සංචාරය යනාදී ක්ෂේත්‍රවල ද්විපාර්ශ්වික සබඳතා



1961 වසරේ චීනය බෙයිජිංහි ලිං ගුආන් විහාරස්ථානයේ ස්ථූපයක නිදන්ගත කෙරුණු දන්ත ධාතූන්වහන්සේ ලංකාවට වැඩම කෙරිණ.

චීනයේ වැඩවෙසෙන දන්ත ධාතූන්වහන්සේ මාස දෙකක කාලයක් ශ්‍රී ලංකාවේ පළාත් අටක, දිස්ත්‍රික්ක පහළොවක වැඩම කරවා මහජනයාට වන්දනා කිරීමට අවස්ථාව සලසන ලදී. මෙය චීන ශ්‍රී ලංකා දෙපාර්ශ්වයෙහිම රාජ්‍යතාන්ත්‍රික ඉතිහාසය තුළ ඉතා වැදගත් සලකුණක් සනිටුහන් කරවන සිදුවීමක් බවට පත් විය.



1980 වසරේ සිට චීන ශ්‍රී ලංකා දෙරටෙහි බෞද්ධාගමික මිත්‍ර සබඳතා තවදුරටත් වර්ධනය වීමට හේතුවෙන් චීන බෞද්ධ සංගමය විසින් ශ්‍රී ලංකාවේ බෞද්ධ විද්වත් කණ්ඩායම් තුනකට වෙන් වෙන් වශයෙන් චීනයේ මිත්‍ර සංචාරයන් සඳහා ඇරයුම් කරන ලදී. චීන බෞද්ධ සංගමයේ සභාපතිවරයාද බොහෝ අවස්ථාවලදී පුළුල් සාකච්ඡා සඳහා විවිධ ඇරයුම් මත ශ්‍රී ලංකාවට ගොස් ඇත.

1987 වසරේ අප්‍රේල් මාසයේ පන්චන් භික්ෂූන්වහන්සේ බෙයිජිං මහජන මහ ශාලාවේ ශ්‍රී ලංකා බෞද්ධ නියෝජිත පිරිස හමු වූහ.

2015 වසරේ ඔක්තෝබර මාසයේ ශ්‍රී ලංකා බෞද්ධ නියෝජිත කණ්ඩායම චීනයේ වූ සී නගරයේ පැවති සිව්වන ලෝක බෞද්ධ සමුළුවට සහභාගි වී අවස්ථාව.










චීන ජාත්‍යන්තර ගුවන් විදුලි (CRI) සිංහල සේවය ආරම්භ වූයේ 1975 වසරේ ජනවාරි මස පළමු වෙනිදාය. පසුගිය වසර 40කට වැඩි කාලයක වර්ධනයෙන් ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනා ගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. එය ශ්‍රී ලාංකික අසන්නන් චීනය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමේ ඵලදායිකම සහ සෘජුම පාලම සහ මෙවලම බවට පත් ව ඇත.









1979 වසරේ අගෝස්තු මස 15 වෙනිදා 'චීන මහජන සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර සංස්කෘතික සහයෝගතා ගිවිසුම'ට අත්සන් තැබීය. 2005 වසරේ අගෝස්තු මස 30 වෙනිදා එම ගිවිසුම යළි වරක් අත්සන් කෙරිණ.

රටවල් දෙකේ සංස්කෘතික ආයතනවල මෙහෙයවීම යටතේ චීනය හා ශ්‍රී ලංකාව අතර සංස්කෘතික හුවමාරු මනා ලෙස වර්ධනය වී තිබේ. සංදර්ශන කලාව, පුරා වස්තු සුරැකුම, ගුවන් විදුලි, රූපවාහිනි හා චිත්‍රපට, බුදු දහම සහ ක්‍රීඩාව යනාදි ක්ෂේත්‍ර තුළ ද්විපාර්ශ්වික සහයෝගතා පූර්ණ ලෙස සිදු කෙරේ.

දෙරට සංස්කෘතිය අමාත්‍යාංශ අත්සන් තැබූ අවබෝධතා ගිවිසුමකට අනුව, 2014 වසරේ සැප්තැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේදී චීන සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවිය.

චීන අනන්‍යතාව ඇති ක්‍රියාකාරකමක් ලෙස සැලකෙන'ප්‍රීතිමත් වසන්ත උත්සවය'ට ශ්‍රී ලංකාවේ ඇත්තේ ඉමහත් ජනප්‍රියත්වයකි.











2003 වසරේ සිට ශ්‍රී ලංකාව චීන ජාතිකයන්ගේ සංචාරක ගමනාන්ත රටක් බවට පත් වී තිබේ. 2005 වසරේ දෙරට සංචාරක දෙපාර්තමේන්තු සංචාරක සහයෝගතා අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ.

2016 වසරේ ශ්‍රී ලංකාවට ගොස් සංචාරය කළ චීන සංචාරකයන්ගේ වාර ගණන දෙලක්ෂ හැත්තෑදහසකට ළඟා විය. එම ප්‍රමාණය 2015 වසරට වඩා 26.4% වර්ධනයකි.









2005 වසරේ සිට කොළඹ සහ චීනයේ බොහෝ නගර අතර සෘජු ගුවන් ගමන් සේවාව ආරම්භ කිරීම සහ චීනයේ ප්‍රධාන නගර කිහිපයක ශ්‍රී ලංකා කොන්සල් කාර්යාල ස්ථාපිත කිරීමත් සමගම ශ්‍රී ලංකාවට පැමිණෙන චීන සංචාරකයන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වී තිබේ.










ඇස් කාච ශ්‍රී ලංකා ජනතාව සහ චීන ජනතාව එකිනෙකාට මිත්‍රත්වය දැක්වීමේ විශේෂ සම්බන්ධයක් බවට පත් වී තිබෙන බව කිව හැකිය. මෑත වසර දහයක් පමණ තුළ ශ්‍රී ලංකාව චීනයට ඇස් කාච 1000කට වැඩි සංඛ්‍යාවක් පරිත්‍යාග කර ඇත. ශ්‍රී ලංකාවෙන් ඇස් කාච පිළි ගත් චීන රෝගීන් බොහෝ දෙනෙකුට යළිත් ලෝකය පෙනීමට හැකි විය. ඔවුහු චීනයේ බෙයිජිං, ෂාංහයි, ටියැන්චින්, ශෙන්චෙන්, ගුවංචෞ, තායිවානය සහ හොංකොං යන ප්‍රදේශවල සිටිති.

2014 වසරේ සැප්තැම්බර මාසයේ චීන ජනාධිපති ෂී ජින් පිං මහතා ශ්‍රී ලංකාවේ චාරිකාවක නිරත වූ අවස්ථාවේදී එවක ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ ආර්යාව වන ශිරන්ති රාජපක්ෂ මහත්මිය චීන ජනාධිපතිවරයාගේ ආර්යාව වන පෙං ලී යුවාන් මහත්මියට ඇස් කාච 10ක් පරිත්‍යාග කළාය.










ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං, ශී යුයෑ, චෙන් ගුවැන් වන්

# ශ්‍රී ලංකාවේ ගංවතුර සහ නාය යාම් විපත් පිළිබඳව චීනය දැක්වූ කඩිනම් සැලකිල්ල

ශ්‍රී ලංකාවේ ගංවතුර සහ නාය යාම් විපත් පිළිබඳව චීන ජනාධිපති ෂී ජින් පිං මහතා ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත සංවේග පණිවිඩයක් යොමු කළේය.

චීන ජනාධිපතිවරයා විපතින් මිය ගියවුවන් පිළිබඳව ගැඹුරු ලෙස සිය කණගාටුව පළ කළ අතර ඊට ගොදුරු වූවන් හා ඔවුන්ගේ ඥාතීන් කෙරෙහි අවංක කණස්සල්ල පළ කරන බව එම පණිවිඩයෙහි සඳහන් විය.

ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික මිතුයෙකු වශයෙන් චීනය විපත් සහන සැලසීමේ කටයුතුවලට මුළුමනින් ම අනුබල දීමට සූදානම් බව චීන ජනාධිපති ෂී ජින් පිං මහතා කියා සිටියේය.

ශ්‍රී ලංකා රජය හා ජනතාව විපතෙන් මිදී සිය නිවාස යළි සංවර්ධනය කරනු ඇතැයි තමා විශ්වාසයෙන් සිටින බව හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ ගංවතුර සහ නාය යාම් විපත් පිළිබඳව චීන අග්‍රාමාත්‍ය ලී ක ච්‍යාං මහතා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වෙත සංවේග පණිවිඩයක් යොමු කළේය.

ශ්‍රී ලංකා රජයට ද විපතට ලක් ජනතාවට ද අවංක අනුකම්පාව සහ කණගාටුව දක්වන බවත් ශ්‍රී ලංකාවේ ආපදා සහන කටයුතු සඳහා චීනය මුළු ශක්තියෙන්ම අනුබල දීමට කැමති බවත් චීන අග්‍රාමාත්‍යවරයා යොමු කළ පණිවිඩයේ සඳහන් විය.

ශ්‍රී ලංකාවේ විපත් තත්වය පිළිබඳව චීන විදේශ ඇමති වං යී මහතා විසින් ශ්‍රී ලංකා විදේශ ඇමති රවී කරුණානායක මහතාට සංවේග පණිවිඩයක් යොම කර ඇත.

විපතට ගොදුරු වූවන්ට ශෝකට පළ කරමින් ඔවුන්ගේ ඥාතීන් සහ විපතෙන් බලපෑමට ලක් ව සිටින ජනතාවට අනුකම්පාව දක්වන බවත් වං යී මහතා යොමු කළ විදුලි පණිවිඩයේ සඳහන් විය.







ශ්‍රී ලංකාවේ ආපදා සහන කටයුතු සඳහා චීනය හැකි පමණින් සහාය ලබා දීමට කැමති බව ද එහි සඳහන් වේ.

ශ්‍රී ලංකා රජයේ මෙහෙයවීම යටතේ ශ්‍රී ලංකා ජනතාව විපතෙන් බේරා ගෙන උන්හිටිතැන් යළි ගොඩනැගීමට හැකි වනු ඇති බවට විශ්වාස කරන්නේ යැයි ද වං යී මහතා සිය පණිවිඩයෙන් ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාවේ ආපදා සහන කටයුතු සඳහා චීනය යුවාන් මිලියන 15ක වටිනාකම ඇති මානුෂවාදී සහනාධාර භාණ්ඩ පරිත්‍යාග කළේය.

එම සහන භාණ්ඩ රැගෙන චීන විශේෂ ගුවන් යානය ජූනි 03 වෙන දා කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපළට ළඟා විය.

සහනාධාර භාණ්ඩ ශ්‍රී ලංකා රජය වෙත පිළිගැන්වීමේ උත්සවය ශ්‍රී ලංකාවේ චීන තානාපති යී ෂියැන්ලියාං, විදේශ කටයුතු අමාත්‍ය රවී කරුණානායක සහ ආපදා කළමනාකරණ අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.

චීන බෞද්ධ සංගමය රුපියල් මිලියන 22ක මූල්‍ය පරිත්‍යාගයක් කළේය.



ජූනි මස 03 වෙන දා ජනාධිපති නිල නිවසේදී එම මුදල ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත පිරිනැමිණ.

චීන බෞද්ධ සංගමයේ ස්වාමීන් වහන්සේලා විසින් එම මුදල ජනාධිපතිවරයාට පිරිනමන ලදි.

චීනය ශ්‍රී ලංකාවට ලබා දෙන මෙවන් සහයෝගයන් තුලින් දෙරට අතර පවතින දීර්ඝ සබදතා තවදුරටත් වර්ධනය වන බව සඳහන් කළ ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ ගැටළු පැන නගින සෑම අවස්ථාවකදී චීනය ලබා දෙන සහයට ස්තූතිය පළ කරන බව සඳහන් කළේය.

ඒ පමණක් නොව, චීන ව්‍යවසාය සහ එතෙර චීන ජාතිකයන් ද ශ්‍රී ලංකාවේ විපතෙන් පීඩාවට පත් ප්‍රදේශ වෙනුවෙන් මුදල් සහ සහන භාණ්ඩ පරිත්‍යාග කළේය.

චීන යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොටස් සමාග මේ අත්තනගල්ල ජල සැපයුම් ව්‍යාපෘතිය ගංවතුර විපතට ලක් කොළඹ නගරයට ආසන්න ගම්මානයකට ආහාර පාන, ජීවිත භාණ්ඩ සහ ඖෂධ පරිත්‍යාග කර ඇත.


චීන ගමනාගමන ඉදි කිරීම් කණ්ඩායමේ කොළඹ වරාය නගර ව්‍යාපෘති සමාගම කඩිනමින් වතුර පොම්ප 15ක් මිලට ගෙන ඒවා වතුර පොම්ප අතිශයින් අවශ්‍ය නාය යාම් විපත් සිදු වූ ප්‍රදේශ වෙනුවෙන් පරිත්‍යාග කළේය.

මේ අතර ශ්‍රී ලංකාවේ එතෙර චීන ජාතිකයන්ගේ සන්ධානය සහ ශ්‍රී ලංකාවේ චීන මාධ්‍යය එතෙර චීන ජාතිකයන්ගේ මුදල් පරිත්‍යාගයන් විපතට පත්වූවන් වෙනුවෙන් භාරදීමට ක්‍රියා කළේය.











CMEC
塔纳水厂项
人民
携手同心，共渡难
XHS兰卡要闻速递


29052017
DDMMYYYY
Pay: Sri Lanka Red Cross Society
Rupees: Fifteen Million only
Rs. 15,000,000/-
易先良


CMEC
XHS兰卡要闻速递

# ගෙවුණු හැට වසරක ශ්‍රී ලංකාවේ සංවර්ධනය

ඉදිරිපත් කිරීම : හැන් ජියැන්



1957 වසරේ පෙබරවාරි මස 7 වනදා චීනය සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කෙරිණ. එදා සිට මේ දක්වා බලන විට, මෙම රටවල් 2ක ආර්ථික සහ සමාජ සංවර්ධනයෙන් විශාල වෙනස්කම් සිදු ව තිබේ. චීනය දිළිඳු රටක සිට ලෝකයේ 2 වන ආර්ථිකය බවට පත් වී ඇති අතර, ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ මෙන් ම ඉන්දීය සාගර කලාපීය වැදගත් රටක් බවට පත් වී තිබේ. එහෙයින් චීන-ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සබඳතාවේ 60 වන සංවත්සරය නිමිත්තෙන්, ගෙවී ගිය වසර 60 තුළ චීනයේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් කථා කරන අතරතුර ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමන සමාලෝචනය කිරීමට ද අවශ්‍යතාවකි.

දළ වශයෙන් සඳහන් කළහොත්, වසර 1948 නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ සංවර්ධනය අදියර 2 කට වෙන් කළ හැකි ය.

වසර 1948ත් වසර 1977ත් අතර කාලයක එහි පළමුවන අදියරයි. එම කාලපරිච්ඡේදය තුළ ආර්ථිකයට ජනසතුකරණය හඳුන්වාදුන් අතර ජාතික ආර්ථිකය වර්ධනය කිරීමට ද ශ්‍රී ලංකා රජය පියවර ගත්තේ ය. කෙසේ වෙතත්, යටත්විජිත කාලයේ හඳුන්වාදුන් අපනයන ආර්ථිකය අදට ද ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන කොටසකි. එනම් තේ, රබර් සහ පොල් යන නිෂ්පාදන අපනයන ආදායම් තවමත් රටේ ප්‍රධාන ආදායමකි.



එම කාලය පිළිබඳ ව විශේෂ භාණ්ඩයක් සඳහන් කිරීමට අවශ්‍ය ය. එය රබර් ය. කුමක් නිසා ද යත්, පසුගිය සියවසේ 50 දශකයේ මුල් කාලයේ කොරියානු අර්ධද්වීපයේ ඇතිවූ යුද්ධයක් හේතුවෙනි, රබර්වල ජාත්‍යන්තර මිල විශාල වශයෙන් ඉහළ ගියේ ය. එය වසර 1912 සිට එම කාලය දක්වා වූ ඉහළ ම මට්ටමට වර්ධනය විය. එම කෙටි කාලය ශ්‍රී ලංකාවේ රන් කාලයක් ලෙසට සඳහන් කළ හැකි ය. එම කාලයේ චීනය සහ ශ්‍රී ලංකාව එකඟවූ රබර් සහල් ගිවිසුම ද විශේෂත්වයකි.

වසර 1956 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ රජය ආර්ථික ජනසතුකරණය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේ ය. එමෙන් ම, ස්වයං පෝෂිත ආර්ථිකයක් ගොඩනැගීමට ද රජයේ අපේක්ෂා විය. යම් යම් ජයග්‍රහණ අත්පත් කර ගත්ත ද විදේශ විනිමය හිඟය ඇතුළු ඒ ඒ හේතු නිසා එම කාලයේ හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ අභියෝග බොහෝමයකට මුහුණ දුන්නේ ය. වසර 1965 දී ශ්‍රී ලංකා එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජය පිහිටුවිය. ආර්ථික නිදහස්කරණය හඳුන්වාදීමට රජය පියවර ගත්තේ ය. ඒ යටතේ, කෘෂිකර්මාන්තය සහ අපනයනය කැපී පෙනෙන ලෙස වර්ධනය විය. වසර 1970 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛව යළි රජයක් බිහිවිය. ආර්ථිකය තවදුරටත් ජනසතුකරණය කිරීමට රජය පියවර ගත්තේ ය.

වසර 1977 සිට වසර 2009 දක්වා වූ කාලය ශ්‍රී ලංකා සංවර්ධනයේ 2 වන අදියරයි. එම කාලපරිච්ඡේදය තුළදී ආර්ථිකයට නව ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට රජය පියවර ගත්තේ ය. උදාහරණ වශයෙන් සඳහන් කළහොත්, විදේශ ආයෝජන ආකර්ශනයකිරීම, නිදහස් වෙළඳ කලාප ස්ථාපිතකිරීම, පෞද්ගලිකරණය හඳුන්වාදීම යනාදී පියවර රජය විසින් ගනු ලැබිණ. මහවැලි සංවර්ධන ව්‍යාපාරය වසර 1988 දී ආරම්භවීම විශේෂත්වයකි. එය ශ්‍රී ලංකාවේ දැවැන්තම සංවර්ධන යෝජනා ක්‍රමයක් ලෙසට සැලකෙයි. එහි අරමුණ වූයේ කෙටි කාලයක් ඇතුළත සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් නිම කොට, එය රටේ සමස්ථ සංවර්ධනයට දායක කර ගැනීමයි. හෙක්ටාර 130000 ක් අස්වද්දන්ට තරම් ජලයත්, ජාතික විදුලි බල පද්ධතියට මෙගාවොට් 450ක් එක් කිරීමත් එහි සංවර්ධන අරමුණු විය. මේ යටතේ කොත්මලේ, වික්ටෝරියා, මාදුර ඔය, රන්දෙනිගල සහ පහළ ගංගා සංවර්ධන වැඩසටහන 2 ක්‍රියාත්මක විය. ස්වීඩනය, බ්‍රිතාන්‍යය, කැනඩාව, ජර්මනිය, ජපානය ආදි රටවල් එම යෝජනා ක්‍රම සඳහා මූල්‍යාධාර සැපයූයේ ය.

1994 වසරේදී, පෞද්ගලිකරණය තවදුරටත් වර්ධනයකිරීමට කුමාරතුංග මහත්මිය ප්‍රමුඛ රජය තීරණය කළේ ය. එම කාලය තුළ, ශ්‍රී ලංකා ආර්ථිකයේ විශාල වෙනස්කමක් ඉස්මතු විය. ශ්‍රී ලංකාව ක්‍රමයෙන් කෘෂිකාර්මික භාණ්ඩ අපනයනය කරන රටක සිට කෘෂිකර්මාන්තනය සහ කාර්මික නිෂ්පාදනය මුසුවූ අපනයන රටක් බවට පත් විය. එමෙන් ම, වෙළඳ ගනුදෙනු ප්‍රමුඛ සේවා අංශවල වර්ධනය විශේෂත්වයකි. වසර 2000 වන විට එය ජාතික ආර්ථිකයෙන් සියයට පනහක් ගෙන විශාලතම ආර්ථික අංශයක් බවට පත් විය.













දෙවන සංවර්ධන අදියර තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික අංශ බොහෝමයක් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. තේ පිළිබඳ ව සඳහන් කරන විට, විදේශීය රටවල පාරිභෝගිකයන් තුළ ඔසෝන් හිතකාමී පිරිසිදු ශ්‍රී ලංකා තේ ප්‍රචලිතකිරීමට ලාංඡනයක් ලියාපදිංචියකිරීම සඳහා ව්‍යාපෘතියක් හඳුන්වාදීම විශේෂත්වයකි.

රබර් පිළිබඳ ව සඳහන් කරන විට, රබර් පර්යේෂණ ආයතනය හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වසර ගණනාවක් මුළුල්ලේ කෘෂි විද්‍යාත්මක ක්‍රම භාවිතය හා තාක්ෂණයේ වැඩි දියුණු කිරීම් තුළින් රබර් නිෂ්පාදනයේ ඵලදායීතාවය ඉහළ නැංවීමට පියවර ගෙන තිබේ. ඒ සඳහා රබර් ෂීට් වියළීම සඳහා එක්දින වියළුම් කුටීර ක්‍රමයක් වැඩිදියුණුකිරීම, ශල්‍ය කර්ම කිරීමේදී පලදින අත්මේස් නිෂ්පාදන කර්මාන්තය සඳහා ප්‍රෝටීන් ප්‍රමාණය අවම කරන සාන්ද්‍ර කිරි නිපදවීම සහ ඉහළ ඵලදාවක් ලබා දෙන නව රබර් ක්ලෝනයන් තොගයක් හඳුන්වාදීම අදාළ අංශ පියවර ගත්තේ ය.

මීට අමතරව, කාර්මික ව්‍යවසාය සහ කාර්මික නිමැවුම් ද එම කාලය තුළ සීඝ්‍රයෙන් වර්ධනය වී තිබේ. අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගත් රෙදිපිළි, ඇගළුම් සහ සම් නිෂ්පාදිත කර්මාන්ත කාණ්ඩය එම කාලය තුළ ආන්තික වර්ධනයක් පෙන්නුම් කළේ ය. එමෙන් ම ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභ අනුපාතිකය එම කාලය තුළ විශාල වශයෙන් වැඩි විය.





මීට අමතරව, සංචාරක කර්මාන්තය එම කාලය තුළ ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වීම විශේෂත්වයකි. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ ව යොමු කිරීමේදී වැදගත් කලාප 5ක් නම් කළ හැකි ය. ඒවා නම් දකුණු වෙරළ කලාපය, මහ කොළඹ, උඩරට කලාපය, නැගෙනහිර වෙරළ කලාපය ඇතුළු ඓතිහාසික නගර ය. රට තුළ පැවති යුධමය වාතාවරණය අවසන්වීමත් සමඟ, විදේශ ගමන් සහ සංචාරක කර්මාන්තයේ නව දැක්මක් ඇති කළේ ය. රට තුළ පැවති වාතාවරණය වෙනස්වීමෙන් අනතුරුව ඇතැම් රටවල් නිකුත් කළ අයහපත් සංචාරක උපදේශ ලිහිල් කෙරිණ. චීන ජාතිකයන් වැඩි පිරිසක් චාරිකා සඳහා ශ්‍රී ලංකාවට පැමිණීම එම කාලය තුළ මතුවූ විශේෂත්වයකි. මේ වන විට වැඩිම සංචාරක පැමිණීම් ඉන්දියාවෙන් වාර්තා වූ අතර, ඉන් අනතුරුව වැඩි ම සංචාරකයන් පැමිණෙන්නේ චීනයෙනි. ඉල්ලුම් ඉහළයාම හේතුවෙන් ශ්‍රී ලංකාවේ තරු පන්ති හෝටල්වල ආහාර පාන සහ නවාතැන් සඳහා වන අයකිරීම් ද ඉහළ නංවා ඇත. කෙසේ වෙතත් සමාන සංචාරක රටවල් හා සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකාව දැඩි තරඟකාරී තත්ත්වයක පවතී. ඉහළ යමින් පවතින අවශ්‍යතාවයන් සපුරාලීමට හෝටල් කාමර සංඛ්‍යාව වැඩි කිරීමටත්, සංචාරක කර්මාන්තයට අදාළ යටිතල පහසුකම් ඉහළ නැංවීමටත් අවශ්‍ය ක්‍රමෝපායයන් තවදුරටත් ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි.

සංවර්ධයේ 2 වන අදියර තුළ, වසර 2009 යුද්ධය සහ අවසන් වීමෙන් පසුව චීන ආයෝජන ශ්‍රී ලංකාවට යොමුවීම විශේෂත්වයකි. මේ වන විට, ශ්‍රී ලංකාවේ විශාලතම ආයෝජකයා චීනයයි.

රටක සංවර්ධනය සඳහා යටිතල පහසුකම් තීරණාත්මක මෙහෙවරක් ඉටු කරයි. එය දැන සිටින චීන ආයෝජකයන් සිය ප්‍රධාන ඉලක්කයන් ලෙසට ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයට යොමු කරයි. මේ වන විට, ශ්‍රී ලංකාවේ මහ මාර්ග, දුම්රිය මාර්ග, වරාය, විදුලි බලාගාර සහ අන්තර් ජාල ඇතුළු ක්ෂේත්‍ර රැසක චීන ආයෝජනය සිදු කර තිබේ. උදාහරන වශයෙන් සඳහන් කළහොත්, කටුනායක ගුවන් තොටුපොළ සහ කොළඹ නගරය අතර අධිවේගී මහ මාර්ග, කොළඹ සහ මාතර අතර අධිවේගී මාර්ගය, වසර 90 තුළ ශ්‍රී ලංකාවේ ප්‍රථම දුම්රිය මාර්ගය වන දකුණු දුම්රිය මාර්ගයේ යනාදියේ ඉදිකිරීම් කටයුතු සඳහා චීන සමාගම් දායක විය. මීට අමතරව, වඩා පහසු අන්තර් ජාල සේවාවක් ශ්‍රී ලාංකිකයන්ට ලබා දීමට චීන සමාගම් කටයුතු කර තිබේ. ඒ හේතුවෙන් ශ්‍රී ලාංකිකයන් අන්තර් ජාල භාවිතය සඳහා සිදු කරන වියදම අඩු විය. දැනට මාසික ගාස්තුව ඇමරිකානු ඩොලර් 5 ක් පමණ ය. එමෙන් ම, ශ්‍රී ලංකාව ලොව පුරා වේගවත් අන්තර් ජාල සේවාවකට හිමිකම් කියයි. තව ද, නොරොච්චෝලේ විදුලි බලාගාරය, කොළඹ වරාය නගරය, හම්බන්තොට වරාය වැනි මහ පරිමාණ යෝජනා ව්‍යාපෘති සඳහා ද චීන ආයෝජකයන් දායක වී ඇත.

විශේෂයෙන් ම චීනය ඉදිරිපත් කළ එක් තීරයක් එක් මාවතක් යන සංකල්පය යටතේ, චීනය සහ ශ්‍රී ලංකාව අතර පවතින සහයෝගතා තවදුරටත් වර්ධනය වීමේ ඉඩ ප්‍රාස්ථා ඇති වී තිබේ.






# ධර්මය සොයා ගිය පාහියන් හිමියන්




ශ්‍රී ලංකා-චීන සාම්ප්‍රදායික මිතුදම පිළිබඳ ව සඳහන් කරන විට ස්වාමීන් වහන්සේ නමකගේ නාමය නිතැතින්ම සිහිපත් කළ යුතුය. ශ්‍රී ලංකාවේ කන්ද උඩරට මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ තැන්පත් කර ඇති ශ්‍රී දළදා වහන්සේගේ පූජා ඉතිහාසය පිළිබඳ ව තොරතුරු සොයා බැලීමේදී චීන ජාතික පාහියන් භික්ෂූන් වහන්සේගේ චාරිකා සටහන්වලින් වැදගත් තොරතුරු රාශියක් හෙළි වේ.

අනුරාධපුරයේ ධම්මචක්ක ගේය නම් දළදා මාළිගාවේ සිට අභයගිරි විහාරය දක්වා දළදා වහන්සේ වැඩම කරවන ලද පෙරහැර පිළිබඳ සවිස්තරාත්මක සටහනක් උන්වහන්සේ ලියා තිබේ. අනුරාධපුර යුගයේ ලියන ලද ඒ සටහන ශ්‍රී ලංකාවේ දළදා පෙරහැර පිළිබඳ ව ලියැවුණු මුල්ම ලිඛිත සටහන ලෙසට හැඳින් විය හැකිය.

පාහියන් භික්ෂූන් වහන්සේ අනුරාධපුරයේ වසර දෙකක පමණ කාලයක් වැඩ සිට ඇතැයි ඉතිහාසයේ දැක්වේ. එකල එහි ආගමික, සංස්කෘතික, සමාජයීය පසුබිම පිළිබඳ ව තොරතුරු රැසක් උන්වහන්සේ විසින් රචනා කරන ලද "පාහියන් චාරිකා" කෘතියට ඇතුලත් ව තිබේ.



ඉදිරිපත් කිරීම : ලියු හුයි










“පාහියන් ” චීන ඉතිහාසයේ වැදගත් නාමයකි. උන්වහන්සේ චීන-ශ්‍රී ලංකා සම්බන්ධතාව, විශේෂයෙන් දෙරටේ බෞද්ධ ක්ෂේත්‍රය සමීප කිරීම උදෙසා වැදගත් දායකත්වයක් ලබා දුන් භික්ෂූන් වහන්සේ නමකි. උන්වහන්සේ විසින් පරිවර්තනය කරන ලද බෞද්ධ ග්‍රන්ථ චීනයේ බුදුදහමේ වර්ධනයට ඉමහත් බලපෑමක් ඇති කර තිබේ. එම බෞද්ධ ග්‍රන්ථ සඳහා තොරතුරු එක්රැස් කර තිබුණේ ඉන්දියාවෙන් සහ ශ්‍රී ලංකාවෙනි. උන්වහන්සේ ලියූ චාරිකා සටහන චීන ඓතිහාසික පර්යේෂණ ක්ෂේත්‍රයේ පමණක් නොව, ආසියාවේ  බොහෝ රටවල ඓතිහාසික පර්යේෂණ ක්ෂේත්‍රයේත් මහඟු ආදර්ශ ග්‍රන්ථයක් ලෙස අදටත් භාවිත කෙරේ.

පාහියන් හිමියන්ගේ උපන් වර්ෂය පිළිබඳ ව මත කිහිපයක් තිබේ. ඉන් පිළි ගත හැක්කේ ක්‍රි.ව. 334දී පමණ උන්වහන්සේ උපත ලැබූ බවට ඇති මතයය. උන්වහන්සේ පැවිදි දිවියට පිවිසුණේ, වයස අවුරුදු තුනේදීය. ඒ යුගයේ රට පුරා බුදු දහම සමෘද්ධිමත්ව පැවතියද, චීනයේ එදා තිබුණු බෞද්ධ ග්‍රන්ථ අතර විනය පිළිබඳ ග්‍රන්ථ ඉතා අවම වීම, තරුණ පාහියන් භික්ෂූන් වහන්සේගේ දැඩි කණස්සල්ලට හේතු විය.

චීනයේ නැගෙනහිර චින් පෙළපතේ කාලයේ, ක්‍රි.ව. 399යේදී පාහියන් හිමියන් ඉන්දියාවට ගොස් එහි ඇති විනය පිළිබඳ බෞද්ධ ග්‍රන්ථ චීනයට හඳුන්වා දීමට තීරණය කළහ. ඒ වන විට උන්වහන්සේ පසු වූයේ 65 වන වියෙහිය. මුළදී උන්වහන්සේ සමඟ භික්ෂූන් වහන්සේලා සිව් නමක් එම චාරිකාවට එක් ව සිටියහ. තවත් භික්ෂූන් වහන්සේලා පස් නමක් මේ චාරිකාවට එකතු වූයේ අතරමඟදීය. අවසානයේ චාරිකාවට එක් වූ භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව දස නමකි.

පාහියන් භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ එම කණ්ඩායම පැරණි චීනයේ චාංඅන් නගරයෙන් ගමන ආරම්භ කළහ. ඒ අද ෂීඅන් නගරයය. වයඹ චීනයේ තුන්හුවාන් නගරයට බටහිරව පිහිටි කාන්තාරය හරහා උන්වහන්සේලා අද “ශින් ච්‍යාං” ලෙස නම් කර





ඇති ප්‍රදේශයට ළඟා වූහ. ඉන් පසු ව හින්දු ගංගාව තරණය කර, පාකිස්ථානය හරහා ඇෆ්ගනිස්ථානයට පැමිණියහ. උන්වහන්සේලා යළි පාකිස්ථානයට ප්‍රවේශ වී ගංගානම් ගඟ හරහා ඉන්දියාවට පැමිණ තිබේ. මෙම චාරිකාව ඉතාම අසීරු එකකි. හිමෙන් වැසුණු කඳුකරය තරණය කරමින් ගමන් කරද්දී අධික සීතල නිසා "හුයි චිං" නම් භික්ෂුන් වහන්සේ අපවත් වූහ. කාන්තාරයක් තරණය කිරීමේ අවස්ථාවක, එහි තිබූ කලින් ගමන් කළ අයගේ ඇටසැකිලි සලකුණු මගින් මාර්ග හඳුනා ගත් උන්වහන්සේලා මාසයකට වැඩි කාලයක් පුරා ජනශූන්‍ය කලාපය තරණය කළහ. කෙසේ වුවත්, දැඩි කායික හා මානසික අසීරුතා සහ වේදනා දරා ගනිමින්, පාහියන් භික්ෂුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂුන් වහන්සේලා පැරණි ඉන්දියාවට වැඩම කළහ.

නැගෙනහිර ඉන්දියාවේ වැඩ සිටි කාලයේ, පාහියන් හිමියන් සංස්කෘත භාෂාවත්, විනය පිළිබඳ බෞද්ධ ග්‍රන්ථත් අධ්‍යයනය කළහ. ඉන්දියාවේ වාසය කළ වසර හයක කාලය තුළ උන්වහන්සේ සමීපයේ වැඩ සිටි භික්ෂුන් වහන්සේලාගෙන් කිහිප නමක් ඒ අසීරු සංචාරය තුළදී අපවත් වූහ. ඇතැම් භික්ෂුන් වහන්සේ මේ දුෂ්කර කාර්යයෙන් ඉවත් වී ඉන්දියාවේ රැඳී සිටීමට තීරණය කළහ.

ඒ නිසා පාහියන් හිමියන් තමන් වහන්සේ එකතු කොට ගත් බෞද්ධ ග්‍රන්ථ රැගෙන මුහුදු මාර්ගයෙන් මව්රටට ආපසු යෑමට පිටත් වූයේ තනිවම ය. ඒ ගමනේදී, ශ්‍රී ලංකාව උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ චාරිකාවේ වැදගත් නැවතුම්පොළක් බවට පත් ව තිබූ බව ඉතිහාසය සාක්ෂි දරයි.

වසර 410දී, පාහියන් භික්ෂුන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළහ. උන්වහන්සේ වැඩවාසය කළේ අනුරාධපුරයේ අභයගිරි විහාරයේය. ශ්‍රී ලංකාවේ වාසය කළ කාලයේ මහ බෞද්ධ ග්‍රන්ථ කාණ්ඩ හතරක් එකතු කර ගැනීමට උන්වහන්සේ සමත් වූහ. උන්වහන්සේ ශ්‍රී ලංකාවේ වසර දෙකක පමණ කාලය වැඩ වාසය කළ අතර ඒ වන විට, උන්වහන්සේ චීනයෙන් පිටත් වී වසර 10කට වැඩි කාලයක් ගත වී තිබිණ. උන්වහන්සේට මව්රට පිළිබඳ ව නිතරම සිහිපත් විය. වරක් සිංහල ජාතික බෞද්ධ සැදැහැවතෙක්, බුදු පිළිමයකට සුදු පැහැති චීන සේද අවානක් පූජා කළ ආකාරය දුටු පාහියන් හිමියන් හැඟුම්බරව කඳුළු සැලූ බව සඳහන් වේ.

වසර 411දී, පාහියන් භික්ෂූන් වහන්සේ වෙළෙඳ නෞකාවකට පිවිස චීනය බලා ආපසු යෑමේ ගමන ආරම්භ කළහ. එසේ යාත්‍රා කළ අතර තුර, කුණාටු කිහිපයකටම මුහුණ දුන් නමුත්, එම ගමන දිගටම සිදු කිරීමට උන්වහන්සේ වාසනාවන්ත වූහ. අතරමඟදී, කුණාටුවක් නිසා උන්වහන්සේ ජාවා දූපතට ගොඩ බැස එහි මාස 5ක පමණ කාලයක් ගත කළ බව සඳහන් වේ. පසුව පාහියන් ස්වාමීන් වහන්සේ, චීනයේ ගුවාන්චෝ නගරය කරා ගිය වෙනත් වෙළෙඳ නෞකාවකට පිවිස යළි ගමන ආරම්භ කළහ. අනපේක්ෂිතව, දැඩි සුළඟ නිසා එම වෙළෙඳ නෞකාවට දිසාව වැරදි ගොස් ඇත. නෞකාවේ තැන්පත් ව තිබූ ආහාර පාන අවසන් වීමේ තත්වයට පවා උන්වහන්සේ මුහුණ දී තිබිණ. පසුව, ඒ නෞකාව ඉවුරකට ළඟා විය. නැගෙනහිර චීනයේ ශන්ඩොං පළාතේ ලාඕ ශැන්වලට ඔවුන් පැමිණ ඇති බව පාහියන් හිමියන් ගොඩබිමට ගොඩවීමෙන් පසු දඩයක්කරුවෙකුගෙන් විමසා දැන ගෙන ඇත.

ඉතා දිගු අසීරු චාරිකාවක් එසේ නිම කර තිබූ අවස්ථාවේදී, පාහියන් භික්ෂූන් වහන්සේ, වසර 14ක් පමණ කාලය තුළ රටවල් 30ක සංචාරය කර තිබූ බව ඉතිහාසයේ සඳහන් වේ. චීනයෙන් පිටත් වූ විට, උන්වහන්සේගේ වයස අවුරුදු 65ක් පමණ වූ අතර නැවත චීනයට ආපසු පැමිණි අවස්ථාවේ උන්වහන්සේගේ වයස අවුරුදු අසූවකට ආසන්නව තිබිණ. දිගු චාරිකාවක් අවසන් කිරීමට සමත් වුණු වයෝවෘද්ධ උන්වහන්සේ සෙසු අයට හිතා ගැනීමටවත් නොහැකි අසීරුතාවන් පිළිබඳ ව අත්දැකීම් රාශියකට මුහුණ දී තිබූ බව කියැවේ.

මව්රටට ආපසු පැමිණි පාහියන් භික්ෂූන් වහන්සේ ඉන්දියාවෙන් හා ශ්‍රී ලංකාවෙන් රැගෙන ආ බෞද්ධ ග්‍රන්ථ චීන භාෂාවට පරිවර්තනය කිරීම ආරම්භ කළහ. උන්වහන්සේ විසින් පරිවර්තනය කරන ලද "මහසඟ විනය" ඇතුළු බෞද්ධ ග්‍රන්ථ, චීනයේ බුදුදහමේ වර්ධනයට ඉමහත් සේ දායක වූ බව පිළි ගැනේ. උන්වහන්සේ තම චාරිකා අත්දැකීම් අනුව ලියූ "පාහියන් චාරිකා" කෘතිය, මුළු ලෝකයේම අමරණීය සම්භාව්‍ය කෘතියක් ලෙස සම්භාවනාවට පාත්‍ර වී තිබේ. පැරණි මධ්‍යම ආසියාවේ, දකුණු ආසියාවේ සහ අග්නිදිග ආසියාවේ පැවතුණු රටවල් 30ක පමණ භූ ගෝලීය තත්වය, ගමනාගමනය, ආගම, සංස්කෘතිය, චාරිත්‍ර වාරිත්‍ර, සමාජය සහ ආර්ථිකය පිළිබඳ තොරතුරු එම කෘතියේ සඳහන් ව තිබේ. එම කලාපවල ඉතිහාසය පිළිබඳ ව ගවේෂණය කරන අය අදත් මේ කෘතිය පරිශ්‍රීලනය කරති.

වර්ෂ 420දී, පාහියන් භික්ෂූන් වහන්සේ අපවත් වූහ. උන්වහන්සේ මෙලොවින් නික්ම ගියත් උන්වහන්සේ විසින් චීනයේ බුදු දහමේ වර්ධනයට ඉටු කරනු ලැබූ කැපවීම සහ "පාහියන් චාරිකා" කෘතියෙන් ආසියාවේ රටවල් ගණනාවකම ඓතිහාසික පර්යේෂණය වෙනුවෙන් කරන ලද සේවාව හේතුවෙන් "පාහියන් " නාමය අමරණීය නාමයක් බවට පත් ව ඇත.








# ශ්‍රී ලංකාවේ අවලෝකිතේශ්වර පිළිමය තැන්පත් මාළිගය


චීනයේ ටිබෙට් ස්වායත්තයේ පිහිටි පොටාලා මාළිගය බෞද්ධයන්ට පුණ්‍ය භූමියකි. ටිබෙටයට මිළ කළ නොහැකි සම්පතකි. ඉතිහාසඥයන්ට දැනුම් කෝෂ්ටාගාරයකි. පුරා විද්‍යාඥයන්ට පර්යේෂණාගාරයකි. වාස්තු විද්‍යාඥයන්ට ආදර්ශයකි. දැනුම් පිපාසිතයන්ට පුස්තකාලයකි. සංචාරකයින්ට සරසවියකි. දරු දැරියන්ට තක්සලාවකි. කැටයම්කරුවන්ට කලාගාරයකි. සිත්තරුන්ට පාරාදීසයකි.


චීනයේ ටිබෙට් ස්වායත්තයේ ආගමික, සංස්කෘතික හා අධ්‍යාපනික පුනරුදයේ නියමුවා වන ක්‍රිස්තු වර්ෂ **617**දී රාජාභිෂේකයට පත් සොන්සන් ගම්-පො කුමරු අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේ සිය ආධ්‍යාත්මික ආරක්ෂකයා වශයෙන් සැලකුවේය. එබැවින් ශ්‍රී ලංකාවේ සිට ගෙන ආ අවලෝකිතේශ්වර පිළිමය තැන්පත් කිරීම සඳහා හෙතෙම මාළිගයක් ඉදි කළේය. එම මාළිගය පොටාලා මාළිගයයි.

එම මාළිගයේ වන්දනා කුටි, පූජා කුටි, ලැගුම් හා පරිපාලන කුටි ආදී වශයෙන් කාමර නවසිය නවයක් තිබේ. සාමය සංකේතවත් කරලීම සඳහා එය සුදු පැහැයෙන් පිරියම් කිරීම හේතුවෙන් ශ්වේත මාළිගය වශයෙන් ද හැඳින්විණ.

**1642** වසරේ පස්වන දළයි ලාමා හිමියන් චීන ටිබෙට්යේ පාලන බලය අත්පත් කර ගැනීමත් සමඟම පොටාලා මාළිගයේ ස්වර්ණමය යුගය උදා විය. **1645** වන විට රතු කන්දේ මාළිගාවේ ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹිණ. ටිබෙට්යේ ආගමික මෙන් ම පරිපාලන කේන්ද්‍රස්ථානය බවට ද එය පත් විය.වසර **40**කට වැඩි පාලන කාලයකින් පසු පස්වන දළයි ලාමා හිමියන් අපවත් වූ කාලයේ උන්වහන්සේගේ

ඉදිරිපත් කිරීම : චාං යෝ යෝ





භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා 1690 වසරේ සුදු මාළිගා ගොඩනැගිල්ල අසල රතු මාළිගයක් ඉදි කෙරිණ. පස්වන දළයි ලාමා හිමියන්ගේ භෂ්මාවශේෂ එහි තැන්පත් කළ අතර වෙනත් පිළිම වහන්සේලා සහ ධාතූන් වහන්සේලා රාශියක් ද එහි ඉදි කෙරුණු කුටිවල තැන්පත් කෙරිණ.

නැගෙනහිර ප්‍රවේශ දොරටුවෙන් ඇතුළු වූ විට සුවිශාල එළිමහන් මණ්ඩපයක් දක්නට ලැබේ. අතීතයේ ලාමාවරුන් ටිබෙට් ඔපෙරාවෙන් නැරඹුවේ එහි සිටය.

මණ්ඩපයට බටහිරින් සුදු මාළිගය පිහිටා තිබේ. ලාමාවරුන්ගේ ලැගුම් කුටි, සාකච්ඡා ශාලා, අධ්‍යයන ශාලා සහ කාර්යාල පරිශ්‍රයන් ද මෙම මාළිගයේ පිහිටා තිබේ. මහල් 13කින් යුක්ත මෙම මාළිගා ගොඩනැගිලිවල බිත්ති ඉතා පළලය. ප්‍රතිමා, ස්තූප හා වටිනා කෞතුක වස්තු සම්භාරයක් රතු මාළිගයේ තැන්පත් කර තිබේ. ප්‍රධාන ශාලාවේ ඇතුලත බිත්ති සරසන අලංකෘත චිත්‍ර නිර්මාණ ගණනාවකි. ශාලාව වටා පූජා කුටි තුනකි. උතුරු කුටිය ශාක්‍යමුනීන්ද්‍රයන්, අනෙකුත් බුදුවරුන් සහ දළයි ලාමා හිමිවරුන් වෙනුවෙන් වෙන් කරයි. දකුණු පූජා කුටිය 8වන සියවසේ ඉන්දියාවෙන් පැමිණි පද්මසම්භව තෙරුන් වහන්සේ වෙනුවෙන් වෙන් වෙයි. 17 වන සියවසේ නිර්මාණය කරන ලද පද්මසම්භව තෙරුන් වහන්සේගේ රිදී පිළිමය වඩාත් කැපී පෙනෙයි.

පැරණි ධර්ම ග්‍රන්ථ, පට සළු මත අඳින ලද දුර්ලභ චිත්‍ර ආදිය පමණක් නොව පැරණි අවි ආයුධ වර්ග පවා පොටාලා මාළිගාවේ තැන්පත් කෙරේ. ඇතුල් ශාලාවන්හි ලී කණු සියල්ල ඉතා සියුම් කැටයමින් අලංකෘතයි.

පොටාලා මාළිගාව ආගමික හා සංස්කෘතික කලාගාරයක් ලෙස ද හැඳින්වෙයි. මෙම විස්මිත කලාගාරය නැරඹීම සඳහා ද වන්දනාමාන කිරීම සඳහා ද දිනපතා ම පාහේ සංචාරකයින් විශාල පිරිසක් පැමිණෙති. එක් දිනකදී මාළිගාව නැරඹීමට අවසර ලබා දෙන්නේ 2300කට පමණි.

ශ්‍රී ලංකාවෙන් ගෙන ආ අවලෝකිතේශ්වර පිළිම වහන්සේ අද වන විට පොටාලා මාළිගාවට ආධ්‍යාත්මික ආරක්ෂාව සලසයි. මාළිගයේ ඇති රන්, රිදී, ලෝකඩ ආදියෙන් තැනූ ලක්ෂ දෙකකට වැඩි පිළිම අතරින් වැදගත් ම පිළිමය වශයෙන් ද සැලකෙන්නේ මෙම වටිනා අවලෝකිතේශ්වර පිළිමයයි.












# ශ්‍රී ලංකා-චීන අලි මිතුදම



ඉදිරිපත් කිරීම : ෂෙං ලී



චීනයට ළබැඳි ශ්‍රී ලාංකිකයෙකුට නම් චීන මහා ප්‍රාකාරය ජීවිතයේ සිහින ගමනාන්තයකි. එමෙන්ම ශ්‍රී ලංකාවට ඇලුම් කරන චීන ජාතිකයෙකුගේ ආකර්ෂණීයතම සංචාරක ස්ථාන අතරින් ලංකාවේ පින්නවල අලි අනාථාගාරය අමතක කළ නොහැකි ස්ථානයකි. සිංහල බස උගත් මා හද තුළ පින්නවල අලි අනාථාගාරය පිළිබඳ ඇත්තේ ද විශේෂ හැඟීමකි. මෙම සුවිශේෂ හැඟීම ඇති වී තිබෙන්නේ එහි උපන් නමුත් දැන් බෙයිජිං සත්වෝද්‍යානයේ වෙසෙන මිගාර නම් අලියෙකු නිසාවෙන් බව කියන්නට කැමැත්තෙමි.

සේද මාවත ඔස්සේ පුරාණයේ සිට චීනය හා ශ්‍රී ලංකාව අතර පැවති මිත්‍රත්වය යුගයෙන් යුගය වර්ධනය වී වර්තමානයේ වඩාත් පරිපූර්ණ අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ.1957 වසරේ චීන- ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතාව ස්ථාපිත කිරීම රටවල් දෙකේ මිත්‍රත්ව ඉතිහාසයේ සන්ධිස්ථානයක් වශයෙන් සැලකිය හැකි ය. මේ වසරේ චීන- ශ්‍රී ලංකා තානාපති සබඳතාව වසර 60ක් සපිරෙන බව සිහි වන විට, මීට වසර 10කට පෙර බෙයිජිං සත්වෝද්‍යානයේ මා ලද අත්දැකීමක් යළි සිහියට නැගේ.



චීන- ශ්‍රී ලංකා තානාපති සබඳතාව ස්ථාපිත කිරීමේ 50වැනි සංවත්සරය නිමිති කරගෙන 2007 වසරේ පෙබරවාරිමස එවක ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා චීනයේ සංචාරය කළ අවස්ථාවේ චීන රජයට සුවිශේෂ තිළිණයක් පරිත්‍යාග කළේ ය. ඒ, පින්නවල අලි අනාථාගාරයේ හැදුණු වැඩුණු මිගාර නමැති සුරතල් අලි පැටියෙකි. මීට මාස හතරකට පසු මිගාර  අලි පැටවාගේ 6වැනි උපන් දිනය වෙනුවෙන් බෙයිජිං සත්වෝද්‍යානයේදී උත්සවයක් සංවිධානය කළේ ය. බෙයිජිං සත්වෝද්‍යාන පරිපාලනය ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමග එක්ව සංවිධානය කළ මෙම අලි පැටවාගේ උපන් දින උත්සවයට මා සේවය කරන චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල අංශය නියෝජනය කරමින් මම මාධ්‍ය සහය ලබා දුන්නෙමි .

එදින චීනයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් මෙන්ම චීන ජාතිකයන් විශාල පිරිසක් සත්වෝද්‍යානයේ අලි මැදුර ඉදිරිපිට එක්රොක් වූ අයුරුත් චීන හා ලාංකික දරු දැරියන් මිගාරට සුබ පතමින් නටමින් ගයමින් සිටි අයුරුත් බෙල්ල වටා රතු පටියක් පැළඳ සිටි මිගාර හොඬවැල වනමින් සතුට පළ කළ අයුරුත් විශාල උපන් දින කේක් එකකින් මිගාරට එක් කෑල්ලක් සෙනෙහසින් කවන ලද අයුරුත් අද ඊයේ වගේ මගේ මතකයට නැගේ.

එය ශ්‍රී ලංකාවේ අලි පැටවෙකු වෙනුවෙන් චීනයේදී මෙලෙසින් උපන් දින උත්සවයක් පැවැත්වූ පළමු අවස්ථාව විය. අලියා ලංකාවේදී වැඩි සැලකීමට හා ගෞරවාදරයට පාත්‍ර වන සතෙකි. ශ්‍රී ලංකාව මිත්‍රත්වයේ සංකේතයක් වශයෙන් අලියෙකු චීනයට පරිත්‍යාග කළේ එබැවිනි. මිගාරට ආදරය කරන චීන දරු දැරියන් මිගාරත් සමගම ලොකු මහත් වෙද්දී ශ්‍රී ලංකාව සහ චීනය අතර මිත්‍රත්වය ද ශක්තිමත් වනු ඇතැයි එවක චීනයේ ශ්‍රී ලංකා තානාපති කරුණාරත්න අමුණුගම මහතා උපන් දින උත්සව අවස්ථාවේදී මා සමග පැවති සම්මුඛ සාකච්ඡාවේදී පවසා තිබිණ.

චීනය හා ශ්‍රී ලංකාව අතර ඇති අලි මිතුදම පිළිබඳ සොයා බැලීමේදී මිගාරට පෙර ලංකාවෙන් චීනයට තවත් අලි පැටවුන් දෙදෙනකු තිළිණ කර තිබෙන බව දැන ගන්නට ලැබිණ. 1972 වසරේ ජුනි මාසයේ සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ චීන නිල සංචාරයට මිතුරා නැමති අලි පැටවෙක් ද එක් විය. අලුත ඉදි කළ බෙයිජිං අගනුවර ක්‍රීඩාංගනයේදදී එවක චීන අගමැති චෞ එන් ලායි මැතිතුමා සහ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ සහභාගිත්වයෙන් ඉතාමත් හරසරින් උත්සවයක් පැවැත්විණ.ඒ, මිතුරා අලි පැටවා නිල වශයෙන් චීන රජයට බාර දීම සඳහා ය. මිතුරා අලි පැටවා ඇත්තෙන් ම එකල චීන ළමුන් එනම් මගේ මාපිය



පරම්පරාවේ මිතුරෙකු බවට පත් විය. 1979 වසරේ එවක ශ්‍රී ලංකා ජනාධිපති ආර්.ප්‍රේමදාස මහතා චීන රජයට තවත් අලි පැටවෙකු තිළිණ කිරීමට කටයුතු කළේ ය. අරලිය නමැති එම අලි පැටවා එම වසරේ සැප්තැම්බර් මාසයේ චීනයේ බෙයිජිං සත්වෝද්‍යානයට පැමිණ මිතුරා සමග එකට සිටි බව ඒ කාලයේ චීන-ශ්‍රී ලංකා මිත්‍ර සබඳතාවේ උණුසුම් පුවතකි.

දැන් වසර 40කට ආසන්න කාලයක් ගෙවී ගොසින් ය. චීන-ශ්‍රී ලංකා අලි මිතුදමේ පළමුවෙන් සටහන් තැබූ මිතුරා අලියා 2008 වසරේ මිය ගිය ද අරලිය සහ මිගාර යන අලි දෙදෙනා චීනයේ සුව සේ ජීවත් වෙති. කාලය කෙතරම් ගෙවී ගිය ද අලි මිතුදම ඔස්සේ සෙනෙහසින් බැඳි චීන හා ශ්‍රී ලාංකික ළමා පරපුර අනාගතයේදී එම සෙනෙහස චීන-ශ්‍රී ලංකා මිත්‍රත්වය සමගින් ඉදිරියට ගෙන යනු ඇතැයි සිතමි. එමෙන්ම වසර 60ක් සපිරුණු චීන-ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතාව විවිධ ක්ෂේත්‍රයන්හි තහවුරු වී තව තවත් ඉදිරියට වර්ධනය වනු ඇතැයි විශ්වාස කරමි.

"ආදරණීය මිගාර, ඔයා චීනයට පැමිණියේ ශ්‍රී ලාංකික ජනතාව චීන ජනතාවට දක්වන ආදරය හා ආශීර්වාදය රැගෙනයි. ඔයා මේ රටවල් දෙකේ මිත්‍රත්වයේ දූතයෙක්. චීන-ශ්‍රී ලංකා මිත්‍රත්වය අඛණ්ඩව ඉදිරියට ගෙන යාම ගැන අපට විශ්වාසයක් තියෙනවා. ඔයා වගේ අපිත් චීන-ශ්‍රී ලංකා මිත්‍රත්වයේ දූතයන් වෙන්නට කැමතියි."

එදා මිගාර අලියාගේ උපන් දින උත්සවයට එක් වූ බෙයිජිං ජාත්‍යන්තර පාසැලක සිසුන් මිගාර ඇමතූ කතාව එකවරම මගේ දෙසවන්හි රැව්පිළිරැව් දෙන්නට විය.

මිගාර සහ අරලිය අලි දෙදෙනාට නිරෝගීසුවය හා සතුට ප්‍රාර්ථනා කරමි.


චීන-ශ්‍රී ලංකා මිත්‍රත්වය දිගුකල් දිනේවා කියා පතමි...!



# කොන්ෆියුසියස් මුලස්ථානය සහ චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

ඉදිරිපත් කිරීම : සුන් ජියා ජියා සහ වං යිං





හන්බන් හෙවත් කොන්ෆියුසියස් මුලස්ථානය සහ චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය 2009 වර්ෂයේ ජූලි මස 28 වැනි දා කොළඹ ලුම්බිණි විද්‍යාල පරිශ්‍රයේදී ශ්‍රී ලංකා කොන්ෆියුසියස් මධ්‍යස්ථානය නිල වශයෙන් විවෘත කෙරිණ. ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ නිලධාරිහු, චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ නියෝජිතයෝ, චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ ශ්‍රී ලංකා අසන්නන් සංගමයේ සාමාජිකයෝ මෙන්ම ගුරු සිසු 600කට වැඩි පිරිසක් සමාරම්භක උත්සවයට සහභාගි වූහ.










## සුන්දර චීනය ඡායාරූප ප්‍රදර්ශනය







චීන මහජන සමූහාණ්ඩුව පිහිටුවීමේ 60 වන සංවත්සරය නිමිත්තෙන් සුන්දර චීනය නැමති ඡායාරූප ප්‍රදර්ශනය 2009 වර්ෂයේ ඔක්තෝබර් මස 19 වනදා මහනුවර ධර්මරාජ විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ. ශ්‍රී ලංකාවේ චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සංගමයේ සාමාජිකයන්, ගුරු වරුන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු 2500ක පමණ පිරිසක් ඊට සහභාගි විය.

## චීන අධ්‍යාපන ප්‍රදර්ශනය





2010 වර්ෂයේ මැයි මස 21 හා 22 යන දෙදින තුළ ශ්‍රී ලංකාවේ පැවති පළමු වන චීන අධ්‍යාපන ප්‍රදර්ශනයට එක් වූ ආකාරය මේ.

ශ්‍රී ලංකාවේ එවක චීන තානාපතිනිය, එවක ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යවරයා ඇතුළු නිලධාරීන් එහි කුටිය නිරීක්ෂණය කළේය.

## චීන ජාතන්තර ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිරීක්ෂණ චාරිකාව







2010 වර්ෂයේ ජූලි මස 6 වැනි දා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත වූ චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල් වාං ගෙන්ග්නියැන් මහතා චීන භාෂා අධ්‍යාපන පෙළ පොත් එවක ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතාට පිරි නැමීය.

## අධ්‍යාපන සංචාරය

චීන භාෂාව හදාරන සිසු සිසුවියන්ට චීන -ශ්‍රී ලංකා මිත්‍රත්වය හා සංස්කෘතිය පිළිබඳව වැඩි අවබෝධය ලබා දීම සඳහා අධ්‍යාපන සංචාරයන් කිහිපයක් සංවිධානය කෙරිණ.

කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල පිහිටි පාහියන් ගල, ගාල්ල ජාතික නාවික කෞතුකාගාරය යන ස්ථානවල අදාළ වැඩසටහන් පැවැත්විණ.








## චීන සංස්කෘතික සංදර්ශනය











හන්බන් හෙවත් කොන්ෆියුසියස් මූලස්ථානයේ සහය ඇතිව 2011 වර්ෂයේ පෙබවාරි මස 10 වැනි දා චීන සංස්කෘතික සංදර්ශනයක් කොළඹ නගරයේ ටවර් හෝල් රඟහලේදී පැවැත්විණ.

එවක ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යවරයා ඇතුළු අමාත්‍යවරු ශ්‍රී ලංකාවේ සිටින චීන නියෝජිතයන් ශ්‍රී ලංකා සිසු සිසුවියන් ඇතුළු 1500කට වැඩි පිරිසක් ඊට සහභාගි වූහ.


## චීන හන්බන් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා කොන්ෆියුසියස් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරිනියගේ නිරීක්ෂණ චාරිකාව

2013 වර්ෂයේ පෙබරවාරි මස 26 වැනි දා චීන හන්බන් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා කොන්ෆියුසියස් ආයතනයේ ප්‍රධාන විධායිකා ෂු ලින් මහත්මිය ශ්‍රී ලංකාවේ නිරීක්ෂණ චාරිකාවට එක් වූවාය.

ශ්‍රී ලංකාව ඇතුළු ලොව පුරා චීන භාෂාව හා සංස්කෘතිය ප්‍රචලිත කිරීමට ෂු ලින් මහත්මිය ඉටු කළ මෙහෙවර පිළිබඳව එවක අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා අගය කළේය.






兰比尼广播孔子课堂
办得非常好！感谢
国际广播电台，感谢斯
里兰卡广播集团的朋
友们！
中国和斯里兰卡友谊
万古长青！
国家汉办
孔子学院总部
许琳





## 5වැනි සංවත්සර සැමරුම් උත්සවය







2014 වර්ෂයේ ජූලි මස 28වැනි දා, එවක ශ්‍රී ලංකා චීන තානාපති වූ ජ්‍යාං හෝඕ, එවක ශ්‍රී ලංකා පරිසර හා පුනර්ජනනීය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත ඇතුළු 400 පමණ ආරාධිත අමුත්තෝ 5වැනි සංවත්සරය සැමරීමේ උත්සවයට එක් වූහ. චීන තානාපති වූ ජ්‍යාං හෝඕ, ශ්‍රී ලංකා පරිසර අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මධ්‍යස්ථානය වෙත සුභ පැතුම් පිරිනැමීය. එහිදී පොත්පත් හා ශිෂ්‍යත්ව ද ප්‍රදානය කෙරිණ.

## 'චීන වසන්ත උත්සවය' සැමරීමේ උත්සවය












2016 වර්ෂයේ ජනවාරි මාසයේ 30වැනි දා, ' චීන වසන්ත උත්සවය 'සැමරීමේ උත්සවයක් කොළඹදී පැවැත්විණ. ශ්‍රී ලංකා චීන තානාපති යී ෂියැන් ලියාං මහතා ශ්‍රී ලංකාවේ වාසය කරන චීන ස්වදේශකයන්ට සුභ පැතුම් පිරිනැමිය. සැමරුම් උත්සවය පැය 3ක් පුරා ම පැවැත්විණ. කලාත්මක වැඩසටහන් අතරතුර, ක්‍රීඩා හා කුසපත් ඇදීම් අවස්ථා රැසක් පැවැත්විණ.

## ග්‍රන්ථ ප්‍රදානය කිරීමක්



2016 වර්ෂයේ මාර්තු මස 17වැනි දා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය වෙනුවෙන් ග්‍රන්ථ පිරිනැමීමක් සංවිධාන කෙරිණ. ඉගැනීමේ කටයුතු සඳහා වන චීන භාෂා පෙළපොත් හා සංස්කෘතියට සම්බන්ධ පොත් ඊට අන්තර්ගත විය.

## අවුරුදු උත්සවය









සිංහල හින්දු අලුත් අවුරුද්ද සැමරීම සඳහා 2016 වර්ෂයේ අප්‍රේල් මස 10වැනි දා අවුරුදු උත්සවයක් සංවිධාන කෙරිණ. එහිදී සිංහල ක්‍රීඩා ඉසව් හා චීන ක්‍රීඩා ඉසව් රැසක් සංවිධාන කර තිබිණ. ' අවුරුදු කුමරිය' වෙනුවෙන් ශ්‍රී ලංකා තරුණියන් හා චීන තරුණියන් වඩාත් උණුසුම් ලෙස තරඟ වැදිණ.

## ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා සී. එච්. ඊ. සී. ශ්‍රී ලංකා සමාගමේ නියෝජිතයන් අතර සුහද සාකච්ඡාවක්









2016 වර්ෂයේ ජූනි මස 4වැනි දා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සී. එච්. ඊ. සී. ශ්‍රී ලංකා සමාගමේ නියෝජිතයන් සමඟ සාකච්ඡාවක නිරත විය. මෙවැනි ක්‍රියාකාරකම් හරහා සිසු සිසුවියන් සහ ශ්‍රී ලංකාවේ ඇති චීන සමාගම් අතර අන්‍යෝන්‍ය අවබෝධය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාවක් හිමි විය.

## 9වැනි ද්විතීක පාසල් ' චීන පාලම ' චීන භාෂා ප්‍රවීණතා තරඟාවලියේ ශ්‍රී ලංකා තරඟය හා ත්‍යාග පිරිනැමීමේ උත්සවය







2016 වර්ෂයේ ජූලි මස 10වැනි දා, 9වැනි ද්විදීක පාසල් ' චීන පාලම ' චීන භාෂා ප්‍රවීණතා තරඟාවලියේ ශ්‍රී ලංකා තරඟය හා ත්‍යාග පිරිනැමීමේ උත්සවය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ. ශ්‍රී ලංකාවේ චීන දේශපාලන කවුන්සිල පන්ග් චුන් ෂුවේ මහත්මිය එහිදී අදහස් දක්වමින් තරඟයට එක් වූ සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සුභ පැතුම් පිරිනැමුවා ය. එමෙන්ම, ඇය සියු සිසුවියන් චීන භාෂාව හැදෑරීමේදී වැඩිපුර උනන්දුවක් දැක්වීම දිරිමත් කර තිබේ. අපගේ මධ්‍යස්ථානයේ සිසු සිසුවියන් සිව්දෙනෙක් තරඟයේ ප්‍රථම ස්ථාන 4ක් හිමි කර ගත්හ. ප්‍රථම ස්ථාන 2කේ පසු වූ සිසුවියන් දෙදෙනෙක් 2016 වසරේ ඔක්තෝබර් මස ශ්‍රී ලංකාව නියෝජනය කරමින් චීනයේ පැවති අවසාන මහ තරඟයට සහභාගී වී හොඳ ප්‍රතිඵල හිමි කර ගත්හ. 3වැනි හා සිව්වැනි ස්ථානවල පසු වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2නෙක් එම අවසාන මහ තරඟය නැරඹීමට ගියහ.

## ශිෂ්‍යත්වය පිරිනැමීමේ උත්සවය










2016 වර්ෂයේ අගෝස්තු මස 10වැනි දා, එම වර්ෂයේ ශිෂ්‍යත්ව හිමි කර ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව සහතික පිරිනැමීමේ උත්සවය සංවිධාන කෙරිණ. ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය ඇතුළු ආරාධිත අමුත්තන් 100දෙනෙකු පමණ මෙම උත්සවයට සහභාගී වූහ. 2016 වර්ෂයේ අපගේ මධ්‍යස්ථානයේ සිසු සිසුවියෝ 19දෙනෙක් ශිෂ්‍යත්ව ලබා ගත්හ. 2013 වර්ෂයේ සිට මේ දක්වා ශිෂ්‍යත්ව හිමිකර ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව 40 ඉක්මවා ගොස් තිබේ.

## 'කොන්ෆියුසියස් දිනය' සැමරුම් උත්සවය








2016 වර්ෂයේ සැප්තැම්බර් මස 24වැනි දා, ' 12වැනි කොන්ෆියුසියස් දිනය ' සැමරුම් උත්සවය සංවිධාන කෙරිණ. එහිදී, අපගේ මධ්‍යස්ථානයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ගුරු මණ්ඩලය චීන සංස්කෘතියට සම්බන්ධ සංස්කෘතිකාංග රාශියක් ඉදිරිපත් කළහ. ඊට පිහාටු පන්දු, පිං පොං යනාදී ක්‍රීඩා ඉසව් රැසක් ද ඇතුළත් විය.

# මම සහ චීන භාෂාව



ඉදිරිපත් කිරීම : වං යිං



චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ (සී. ආර්. අයි) කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ ශිෂ්‍ය අජිත් රාජසිංහ

චීන භාෂාව ගැන ජීවිතයේ පළමු වතාවට ඇසෙන විට මාගේ වයස අවුරුදු 06ක් පමණී. ඒ 1978 වර්ෂයේය. මම අයියා සමඟ සෙල්ලම් කරමින් සිටියදී, අයියා 'චාන්-චීන්-චූන්' (ඒ නියම චීන නොවන බව පසු කලෙක මම අයියාට පැවසුවෙමි) යන පද වැල කියන්නට පටන් ගත්තේ ය. අප ඔහුගෙන් ඇසුවා ඔහු කියන්නේ කුමක්දැයි කියලා. ඔහු කිව්වේ ඔහු කතා කෙරුවේ චීන භාෂාව කියලා.

මම වයස හතේදී, කරාටේ ක්‍රීඩාව ඉගෙන ගැනීමට පටන් ගත්තෙමි. එතකොට අපේ වීරයා තමයි ' බෲස් ලී '. බෲස් ලී ගැන අහන කොට යළි වරක් චීන භාෂාව ඇසෙන්නට විය.

පසුව මම ' ජෙට් ලී 'ගේ චිත්‍රපට බලන්න හුඟක් ආසා කළෙමි. ඒවායෙන් බහුතරයක් චීනයේ නිපදවපු චිත්‍රපට. එම චිත්‍රපට චීන සංස්කෘතිය ගැන ටිකක් දැන ගන්න උපකාරී විය. චීනයට යන්නත් ආසාවක් ඇති වුණේත් එම කාලයේදීමය.

1997 වර්ෂයේදී වෛද්‍ය විද්‍යාව හැදෑරීම අත්හරින්න මට සිදු විය. හිතට බොහෝ ම දුකක් දැනිණ. හිතේ කාන්සිය මග ඇරෙන්නත් එක්ක මගේ බෑග් එකේ ලොකු චීන අකුරක් ලීවෙමි. ඒ '包' කියලා. ඒකේ තේරුමත් බෑග් එකම තමයි.

එවක, ලංකාවේ චීන භාෂාව ඉගෙන ගැනීමට මනා පහසුකම් නොමැති කාලයකි. එහෙත් ජාතික තරුණ සේවා සභාවේ ජපන් භාෂාව හැදෑරීමේ අවස්ථාව තිබිණ. ඒ නිසා මම පළමුව ඉගෙන ජපන් භාෂාව හැදෑරීමි.

2000 වර්ෂයේ සිට මම හොටෙල් ක්ෂේත්‍රයේ රැකියාවකට යොමු වූයෙමි. ඒ පිළිගැනීමේ නිළධාරියෙක් ලෙසටය. ලංකාවේ විතරක් නෙවෙයි, ඩුබායි හී තරු පහේ හොටල්වල සේවය කිරීමටද අවස්ථාව හිමි විය. එවක ශ්‍රී ලංකාවට පැමිණෙන චීන සංචාරකයන් සංඛ්‍යාව ඉතා අඩුය.

2011 වර්ෂයේදී, මම නේපාලයට ගියෙමි. නේපාලයට බොහෝ චීන සංචාරකයෝ පැමිණෙති. ඔවුහු ඉංග්‍රිසි භාෂාව භාවිත නොකරති.

2013 වර්ෂයේදී, කත්මන්ඩු නුවරදී, මට හොඳ චීන ගුරු මහතෙක් හමු විය. ඔහුගේ නම ' ලඔ යිංග් '. ඒ කියන්නේ උකුස්සා කියන එකයි. උකුස්සා ගුරුතුමා මට වඩා හුඟක් බාල කෙනෙකි. එහෙත් ඔහු මට මනා ලෙස චීන භාෂාව ඉගැන්විය. මම මාස තුනක් ඇතුලත චීන සංචාරකයන්ගේ මර්ගෝපදේශකයෙක් බවට පත් වූයෙමි.



2014 වර්ෂයේ අග භාගයේදී මම යළි ලංකාවට පැමිණියෙමි. ඒ වන විට ලංකාවත් චීන සංචාරකයන්ගේ ආකර්ශෂයට ලක්ව තිබිණ. එවක ලංකාවේ සිටියේ චීන මාර්ගෝපදේශකයන් 08දෙනෙක් පමණි. පුවත් පතක දැන්වීමක් දුටු මම චීන මර්ගෝපදේශක තනතුරකට ඉල්ලුම් කළෙමි. උත්සහය මල්ඵල ගැන්වී 2015 වර්ෂයේ මම ජාතික මර්ගෝපදේශක පාඨමාලාව හැදෑරීමි. එහෙත් නේපාලයේදී ඉගෙන ගත් චීන භාෂාව ඊට ප්‍රමාණවත් නොවිණ. මම චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ (සී. ආර්. අයි) කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ගැන දැන ගත්තේ වාසනාවකටය. එය නිධානයක් සොයා ගත්තා සේ මට හැඟිණ. මම කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ පාඨමාලාව හැදෑරීමෙන් පසු එච්. එස්. කේ.-2, එච්. එස්. කේ. කේ.-2 යන විභාග දෙක සමත් වූයෙමි. ඒ පමණක් නොව, චීනයට ගොස් මාස හයක් චීන භාෂාව ඉගෙන ගැනීමේ අවස්ථාව ද හිමි විය. එය සැබෑ වූ සුන්දර සිහිනයකි. මම එම සිහිනය සැබෑවීම ගැන, එම මධ්‍යස්ථානයේ වංග් ගුරුතුමිය ප්‍රමුඛ ගුරුභවතුන් සියලු දෙනාටම හෘදයාංගම ස්තූතිය පුද කරමි.









දැන් මම ලංකාවේ චීන මර්ගෝපදේශකයන්ට චීන ඉගැන්වීමේහි ද නිරතව සිටිමි. ඒ වගේ ම කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ වැඩිදුරටත් චීන භාෂාව ඉගෙන ගනිමින් සිටී. මේ ලිපිය කියවන ඔබලාත් චීන භාෂාව ඉගෙන ගන්න පටන් ගන්න. චීන භාෂාව ස්වභාව දහමට හරිම කිට්ටුවෙන් යන භාෂාවකි. චීන ඉගෙන ගත්තොත් වරදින එකක් නැත.

加油！加油！(ජයෝ, ජයෝ!) ඒ කියන්නේ 'ජය වේවා ' කියන එකයි.

# 电话购物 - පළතුරු වෙළඳපොළකදී

## 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 我要订一个比萨饼。 | වෝ යො ඩීන් යී ග බි සා බින් .<br>මට අවශ්‍යයි ඇණවුම් කරන්න පීසා රොටියක් . |
| 怎么付钱呢？ | සන්ම ම ෆු චිඇන් න ?<br>කොහොම ද සල්ලි ගෙවන්නේ ? |
| 可以货到付款。 | ක ඉ හෝවු ඩෝ ෆු කුඇන් .<br>භාණ්ඩය ගෙන ආ පසු මුදල් ගෙවන්න පුළුවන් . |
| 你说一个时间。 | නි ශො යී ග ෂ පියැන් බා .<br>ඔයා වෙලාවක් කියන්න. |

## 完整对话 සම්පූර්ණ සංවාදය

### 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 喂，你好。我要订一个比萨饼。 | වෙයි, නි හාවො. වෝ යො ඩීන් යී ග බි සා බින්.<br>හෙලෝ, මට අවශ්‍යයි ඇණවුම් කරන්න පීසා රොටියක් . |
| 大的还是小的？ | දා ද හයි ෂ ශො ද ?<br>ලොකු එකක් ද හෝ පොඩි එකක් ද? |
| 大的。 | දා ද.<br>ලොකු එකක් . |

### 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 怎么付钱呢？ | සන්ම ම ෆු චිඇන් න ?<br>කොහොම ද සල්ලි ගෙවන්නේ. |
| 可以货到付款。 | ක ඉ හෝවු ඩෝ ෆු කුඇන් .<br>භාණ්ඩය ගෙන ආ පසු මුදල් ගෙවන්න . |
| 请送到北京大学西门吧。 | චින් සුං ඩෝ බේයිජිං දා ෂුයැ ෂි මෙන් බා.<br>බේයිජං විශ්වේ විද්‍යාලයේ බටහිර දොරට යවන්න . |
| 好的。 | හාවෝ ද .<br>හරි. |

### 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 您几点能送到？ | නින් ජී තියැන් නෙන්ග් සුං ඩෝ ?<br>වෙලාව කීය ද ඔබ යවන්න පුළුවන්. |
| 你说一个时间。 | නි ශො යී ග ෂ ජියැන් බා.<br>ඔයා වෙලාවක් කියන්න. |
| 大概12 点吧。 | ඩා ගැයි ෂිර් ර් තියැන් බා.<br>දොළොස්ට පමණ . |

### චීන සංස්කෘතියෙන් බිඳක්

විද්‍යුත් වාණිජ්‍යකරණයේ අධි සංවර්ධනයේ ප්‍රතිලාභ ලෙස සජීව ජාල එහෙම නැත්නම් අන්තර්ජාලය මඟින් කෙරෙන වෙළඳාම පාරිභෝගිකයින්ට බොහෝ තේරීම් ලබා දී තියෙනවා. විද්‍යුත් තාක්ෂණය මඟින් භාණ්ඩ මිළදී ගන්නා පාරිභෝගිකයින්ට වැදගත් වන කරුණු ටිකක් මා ඔබට කියන්නම්.

පරිගණක තිරය මත හෝ වෙළඳ ප්‍රචාරක පුවරුවක් මත ඔබට පෙන්වන භාණ්ඩයෙත්, ආදර්ශ ඡායාරූපයේත්, සැබෑ භාණ්ඩයේත් වෙනස්කම් ඇති බව මතක තබා ගන්න. ඒ නිසා ඔබ අන්තර්ජාලය ඔස්සේ හෝ දුරකථනය ඔස්සේ හෝ මිළදී ගැනිමක් සිදු කරන සෑම අවස්ථාවකදීම ඒ සඳහා නියමිත කුවිතාන්සියකුත් ලබා ගන්න. විශ්වාසදායක නිෂ්පාදිතයන්, වෙළඳ ආයතන සෑම විටම තෝරාගන්න. මිළ අධික භාණ්ඩ මිළදී ගැනීමේදී වඩාත් සුපරීක්ෂාකාරී වන්න. පොඩි අතපසු වීමකින් ඔබේ මුදල් වංචාවීමට ඉඩ ඇති බව මතක තබා ගන්න.





# 在服装市场 රෙදිපිළි වෙළඳසැලකදී

## 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 我想买一件旗袍。 | වෝ ෂිඅන් මැයි යී චිඇන් චීපාඕ.<br>මම කැමතියි චීපාඕ ඇඳුමක් මිළදී ගන්න. |
| 这是什么料子的？ | චර් ෂ ෂෙන් ම ලිඕ ත්ස ද ?<br>මේක මොන රෙදි වර්ගයෙන් ද හදලා තියෙන්නේ ? |
| 蓝色的好还是黄色的好？ | ලැන් ස් ද හාඕ හයි ෂ හොං ස් ද හාඕ ?<br>නිල් පාට එක ද හොඳ එහෙම නැත්නම් කහ පාට එක ද හොඳ ? |
| 能试试吗？ | නෙන්ග් ෂර් ෂර් මා ?<br>සුදුසු ද කියලා බලන්න පුළුවන් ද ? |
| 能打折吗？ | නෙන්ග් ඩො චර් මා ?<br>වට්ටමක් ගන්න පුළුවන් ද? |

## 完整对话 සම්පූර්ණ සංවාදය

### 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 您要买什么衣服? | නින් යො මැයි ෂෙන් ම යී ෆු ?<br>මොනවා ද ඇඳුමක් ඔයා මිළදී ගන්න කැමතියි. |
| 我想买一件旗袍。 | වෝ ෂිඅන් මැයි යී චිඅන් චීපාඕ.<br>මම කැමතියි චීපාඕ ඇඳුමක් මිළදී ගන්න. |

### 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 这是什么料子的？ | චර් ෂ ෂෙන් ම ලිඕ ත්ස ද ?<br>මේක මොන රෙදි වර්ගයෙන් ද හදලා තියෙන්නේ ? |
| 真丝的。 | චෙන් ස් ද .<br>සේද. |

### 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 蓝色的好还是黄色的好？ | ලැන් ස් ද හාඕ හයි ෂ හොං ස් ද හාඕ ?<br>නිල් පාට එක හොඳ ද එහෙම නැත්නම් කහ පාට එක හොඳ ද ? |
| 蓝色的更适合您。 | ලැන් ස් ද ගන් ෂිර් හ නින් .<br>නිල් පාට ඔබට වැඩියෙන් සුදුසුයි. |

### 对话四 සිව්වන සංවාදය

| | |
|---|---|
| 能试试吗？ | නෙන්ග් ෂර් ෂර් මා ?<br>සුදුසු ද කියලා බලන්න පුළුවන් ද ? |
| 您穿什么号的？ | නින් චුන් ෂෙන් ම හෞ ද ?<br>ඔබට අවශ්‍ය මොන ප්‍රමාණයක් ද? |
| 中号的。 | චුන් හෞ ද .<br>මධ්‍යම ප්‍රමාණයක් . |

### 对话五 පස්වන සංවාදය

| | |
|---|---|
| 多少钱？ | ඩෝ ශෞ චිඇන?<br>කීයක් ද ? |
| 九百八十元。 | චීයු බැයි බා ෂර් යුවාන්.<br>මේක යුවන් නම සිය අසූයි . |
| 太贵了。能打折吗？ | තයි ගුවේයි ල. නෙන්ග් ධා චර්මා මා?<br>හුඟක් මිලයි. වට්ටමක් ගන්න පුළුවන් ද? |
| 可以打九折。 | කයි ධා චියු චර්.<br>සීයට දහයකින් අඩු කරන්න පුළුවන් . |


### චීන සංස්කෘතියෙන් බිඳක්


රක්ත වර්ණය කියන්නේ චීන සංස්කෘතිය තුළ ඉතාම ගෞරවාන්විත පැහැයක්. චීන වැසියන්ගේ ආධ්‍යාත්මික හා භෞතික අපේක්ෂා රතු පැහැයෙන් ප්‍රතීයමාන කරනවා. සෞභාග්‍යය සහ සතුට රතු පැහැයෙන් පිළිබිඹු කරන බව විශ්වාස කරන නිසායි වසන්ත උත්සව සමයේදී අපට චීන නිවාස වල අලංකාර රත් පැහැ පහන් කූඩු දැක ගත හැක්කේ. චීන මානළියන් රත් පැහැ මඟුල් ඇඳුමෙන් සැරසිලා රතු පැහැති පාවහන් පැළඳ රක්ත වර්ණයෙන් හැඩ කෙරූ දෝලාවෙන් රැගෙන යන්නෙත් ඒ විශ්වාසය නිසායි.


චීනයේදී රතු පැහැය සාර්ථකත්වය සහ සුමට බව පිළිබිඹු කිරීම සඳහාත් යොදා ගැනෙනවා. යමෙකු යහපත් දිවි පෙවෙතක් ගත කරන්නේ නම් එය හඳුන්වන්නේ 走红 (සො හුන්) කියලා. යම් අයෙකු පිළිබඳ ඔහුගේ හෝ ඇයගේ අධීක්ෂකයන් ඉතාම සතුටු නම් එය හඳුන්වන්නේ 红人 (හුන් රඅන්) කියලා. 分红 (ෆෙන් හුන්) කියලා කියන්නේ යම් සබඳතාවයක ප්‍රතිලාභ ඊට හවුල් වන අය අතරේ බෙදා ගැනීමටයි.


රතු පැහැයෙන් ලස්සනත් ප්‍රතීයමාන කරනවා. චීන කාන්තාවක් සළුපිළිවලින් සැරසුන පසු යොදා ගන්නා රූපලාවන්‍යයට 红妆 (හුන් චුඅන්) එහෙම නැත්නම් රතු අංගරචනාව කියලා කියනවා. 红颜 (හුන් යැන්) කියලා හඳුන්වන්නේ කාන්තාවකගේ ලස්සන මුහුණයි. නමුත් බටහිර සංස්කෘතියේදී රතු පහැයට හිමි වෙන්නේ මීට හාත්පසින්ම වෙනස් පිළිගැනීමක්. බටහිර රටවල රක්ත වර්ණයෙන් බහුලව පිළිබිඹු වෙන්නේ ගින්දර, රුධිරය සහ ම්ලේච්ඡත්වයයි. උදාහරණ විදිහට ‘රතු නීතිය’ කියලා බටහිර සංස්කෘතියේදී කියන්නේ ඉතාම දරුණු පාලනයකටයි. රතු පළිගැනීම කියන්නේ රුධිරය සෙලවීමකින් හෝ මරණයෙන් කෙළවර වන පළිගැනීමක් සඳහා. ඒ වගේම ‘රතු අනතුරු ඇඟවීම’ කියන්නේ ඉතාම බරපතළ අනතුරුක් හෝ අවධානමක් හැඟවීමටයි. ගුවන් ප්‍රහාර එල්ල කිරීමේදී මෙවැනි අනතුරු ඇඟවීම් බටහිරේන් අහන්න පුළුවන්.


# අසන්නන්ගේ බිත්ති පුවරුව



























ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං



ඉදිරිපත් කිරීම : වං යිං





# අන්නාසි සහිත කුකුල් මස්



## අවශ්‍ය ද්‍රව්‍ය


- අන්නාසි ගෙඩියක්
- කුකුල් මස් ග්‍රෑම් 500ක්
- ඉඟුරු අවශ්‍ය ප්‍රමාණයට
- සුදු ලූණු කුඩා කැබලි සුදුසු ප්‍රමාණයට
- ලුණු අවශ්‍ය ප්‍රමාණයට

## සාදන ක්‍රමය

- අන්නාසි ගෙඩියේ ලෙලි අයින් කරන්න. තරමක් ඝනකම කැබලිවලට කපන්න. ඊට පස්සේ, ලුණු සහිත ඇල් වතුරින් පොඟවන්න ටික වේලාවක්.
- කුකුල් මස් තරමක් කැබලිවලට කපන්න.
- ඇල් වතුර භාජනයකට දමා රත් කරන්න. කුකුල් මස් කැබලි මේ උතුරන වතුරට දමා පොඩි වේලාවක් තම්බන්න. තම්බා එළියට ගෙන වේලෙන්න හරින්න.
- දැන් තෙල් භාජනයට දාන්න. ඉඟුරු සුදු ලූණු කුඩා කැබලි භාජනයට දමන්න. සුවඳ දැනුණාට පසුව, කුකුල් මස් කැබලි ටික භාජනයට දමන්න. රන්වන් පාට වන තුරු බැද ගන්න.
- අන්නාසි කැබලි ටික භාජනයට දමා කුකුල් මසුත් එක්ක තෙම්පරාදු කරගන්න. ඇල් වතුර ස්වල්පයකුත් දාන්න අවශ්‍යයි. ඊට පස්සේ ලුණු අවශ්‍ය ප්‍රමාණයට දමා තවත් පොඩි වේලාවක් බැද ගන්න. පසුව ලිපෙන් බාගන්න.



ඉදිරිපත් කිරීම : වං යිං



# මිරිස්වලින් සාදා ගන්නා සෝස්

## අවශ්‍ය ද්‍රව්‍ය

- රතු මිරිස් ග්‍රෑම් 750ක්
- පෙයර් ගෙඩියක්
- ඇපල් ගෙඩියක්
- සුදු ලූණු පෙති කීපයක්
- ඉඟුරු පෙති කීපයක්
- තක්කාලි ගෙඩි 5ක්
- ලුණු අවශ්‍ය ප්‍රමාණයට





## සාදන ක්‍රමය

- රතු මිරිස් සෝදලා මතුපිට වේලෙන්න හරින්න.
- මිරිස්වල යට කොටස් ටික ඉවත්කර තීරුවලට කපාගන්න. අපි කලින් ලෑස්ති කළ පෙයර්, ඇපල්, තක්කාලි, සුදු ලූණු, ඉඟුරු කුඩා කැබලිවලට කපගන්න.
- මේ සියලු ද්‍රව්‍ය ටික බ්ලෙන්ඩ් කරන්න.
- මේ මිරිස් සහිත මිශ්‍රණයට ලුණු දාලා හොඳින් මිශ්‍ර කරන්න.
- මිශ්‍රණය ටින් එකකට දාන්න. හොඳට තද කරන්න. අව්ව නැති තැනක තියන්න. දවස් 2 කින් පස්සේ, ආහාරයට ගන්න පුළුවන්.

# නව වන පාඩම
# අස්ථි අනතුරු සඳහා ප්‍රථමාධාර

අද වන විට දිනපතා විශාල අනතුරු ප්‍රමාණයක් සිද්ධ වෙනවා. ඒ අතරින් අප ශරීරයේ අස්ථිවලට සිදු වන අනතුරු ප්‍රධානයි. දිනපතා මෙසේ සිදුවන අනතුරු අතරින් ළමුන් අතර පමණක් වාර්ෂිකව අස්ථි අනතුරු 22,000 ක් පමණ සිදුවනවා.

අස්ථි පද්ධතියට විවිධ හානි සිදු විය හැකියි. ඒවා ප්‍රධාන වශයෙන්

01. අස්ථි භග්න

02. විසන්ධි වීම්

ලෙස හැඳින්විය හැකියි. ඊට අමතරව අස්ථි වටා ඇති පේශීන් ආශ්‍රිතව උළුක්කුවීම් හා කෙණ්ඩ පෙරළීම් සිදුවෙන්න පුළුවන්.

අස්ථි භග්නයක් කියන්නේ කිසියම් අස්ථියක් බිඳීමක්, කැඩීමක් හෝ පපුරායාමක්. මෙවන් අනතුරකදී ප්‍රථමාධාර කරන විට ආරක්ෂිතව, තවදුරටත් අනතුරක් ඇති නොවන සේ සැලකිල්ලෙන් කළ යුතු වනවා.

### රෝගියා හා අවට සියලු දෙනාගේ ආරක්ෂාව තහවුරු කරගැනීම

මෙහිදී අනතුරට පත්වී ඇති පුද්ගලයාට උදව් කිරීමට සමීපවීමේදී ඔබටත් සහායට පැමිණෙන අයට හෝ රැස්වන අයටත්, රෝගියාටත් හානි විය හැකි අවදානම් තත්ත්වයන් තිබේදැයි දැනගන්නත්, එසේ තිබේනම් ඒවායින් ආරක්ෂා වීමටත් අවශ්‍ය පියවර ගත යුතුයි. මෙහිදී අනතුරුවලට පත්ව ඇදවැටී සිටින්නන් දුටු විගස ඒ අය එසේ සිටීම ඒ අයගේ ජීවිතයට හදිසි අවදානමක් ඇති කරනවානම් මිස ඔවුන් වහාම එසවීම, නැගිට්ටවීම ආදිය නොකළ යුතු බව ඉතා වැදගත්.

### අත්‍යවශ්‍ය ජෛව සාධක සිදුවන්නේදැයි දැනගැනීම

රෝගියෙකුට මූලික විනිශ්චය සිදු කරමින් මූලික ජෛව අවශ්‍යතා වන ස්වසනය හා රුධිර සංසරණය ද සිහිය තිබේදැයි පරීක්ෂා කරන ආකාරය අප මීට ඉහත පාඩමකින් සාකච්ඡා කළා. ඒ අනුව මූලික ජෛව ක්‍රියාවලීන් සිදු නොවනවා නම් 'කන්තුක පුප්ඵුශීය පුනරුත්ථානය' ලබා දෙමින් රෝගියා රෝහල්ගත කළ යුතුයි. සිහිය තිබෙනම් හෝ ස්වසනය හා රුධිර සංසරණය මැනවින් සිදු වේනම් අපට අස්ථි භග්නය සඳහා ප්‍රථමාධාර ලබා දීම ආරම්භ කරන්න පුළුවන්.

### අස්ථි භග්නය නිරීක්ෂණය කොට අනතුර මනාව හඳුනා ගැනීම

අස්ථි භග්නයක් හඳුනා ගැනීම සඳහා භග්නයක රෝග ලක්ෂණ හා නිමිති මොනවාදැයි අප දැනගැනීම අවශ්‍ය වෙනවා. පහත දැක්වෙන්නේ අස්ථි භග්නයක රෝග ලක්ෂණ හා නිමිති කිහිපයක්.

**L**oss of Power - අදාළ අවයවයේ බලය හීනවීම

**I**rregularity - අවයවයේ අක්‍රමවත් බව

**P**ain - වේදනාව

**D**eformity - අවයවයේ සාමාන්‍ය හැඩය වෙනස් වීම

**U**nnatural movements - එම අවයවයේ අස්වාභාවික චලන

**S**welling - ආශ්‍රිත ප්‍රදේශයේ ඉදිමීම

**T**enderness - ආශ්‍රිත ප්‍රදේශයේ මෘදු බව

එමෙන්ම භග්නය විවෘත එකක් නම් රුධිර වහනයක් සිදුවීම, පැහැය වෙනස් වීම, කශේරුවට හානි වී ඇති විටක යම් කොටසකට සංවේදනා නොදැනීම, පාද සෙලවීමට නොහැකි වීම, මද සිහි හෝ අසිහි තත්ත්වය, ක්ලාන්තය වැනි රෝග ලක්ෂණ හා නිමිති ද තිබෙන්න ඉඩකඩ තියෙනවා.

### ප්‍රථමාධාර

අස්ථි භග්නයක් ඇතැයි ඉහත රෝග ලක්ෂණ හා නිමිති අනුව හඳුනාගත් වහාම පහත ප්‍රථමාධාර පියවර අනුගමනය කරන්න.

### 1. භග්න වූ අවයවය ඉක්මනින් නිශ්චල කරන්න

අස්ථි භග්නයක් තියෙන විට තවදුරටත් එම අවයව සෙලවීම උචිත නොවේ. නිසි පරිදි නිශ්චල නොකොට සෙලවීමෙන්, ඇවිදීමෙන්, එසවීමෙන් හෝ ඔසවාගෙන යාමෙන් බිඳුණු අස්ථි තවදුරටත් බිඳී යාමට මෙන්ම ඒවා වෙනත් අවයවයන්ට හානි කිරීමටත් අභ්‍යන්තර හෝ බාහිර රුධිර වහනය ඇති කරවීමටත් හේතු වෙනවා.



| අස්ථි භග්නය අතේ, අත් ඇඟිලිවල, උරහිසේ හෝ පර්ශුවල ඇති විට සිහිය ඇත්නම් | අස්ථි භග්නය පාදයේ, හිසේ, බෙල්ලේ, උකුලේ හෝ කොඳු ඇට පෙළේ ඇති විට |
| --- | --- |
|  |  |
| භග්න වූ අතට යටින් අනෙක් අත තබා ක්ෂණිකව නිශ්චල කරන ආකාරය | පුද්ගලයාට පහසු පරිදි හාන්සි කරවා සෙලවීම අවම කරන්න |

### 2. අස්වසන්න



අස්ථි භග්නයක් සිදුවීම හා ඊට බලපෑ හේතුව නිසා තුවාලකරු බිය වී සිටිය හැකියි. එසේ බියවීම හෝ කම්පා වීම රුධිර සංසරණය වැඩි වීමට හේතු වන බව අමුතුවෙන් කිව යුතු වන්නේ නෑ. හෘදය වේගයෙන් ක්‍රියා කරමින් රුධිර සංසරණය වැඩි වන විට අභ්‍යන්තර වශයෙන් රුධිර වහනයක් ඇතිවීමටත්, එමගින් කම්පනය හා සිහිය නැතිවීම දක්වා අනතුර බරපතළ වෙන්න හැකියාව තියෙනවා. එම නිසා තුවාලකරු අස්වැසීම වැදගත්.

### 3. රුධිර වහනයක් ඇත්නම් එය පාලනය කරන්න



විවෘත භග්නයක් නම් බොහෝ විට බාහිර රුධිර වහනයක් දක්නට ලැබේ. එලෙස අභ්‍යන්තරව පිහිටන අස්ථියක් අනතුරකදී බාහිරට විවෘත වීම එහි ජීව ගුණය විනාශ වීමට හේතු විය හැකි වනවා මෙන්ම විශාල රුධිර වහනයක් සිදු වී කම්පනය හා සිහිය නැතිවීමටත්, හෘදය ඇණහිටීම දක්වාත් දුරදිග යාමට හැකියාව තිබෙනවා. ඒ නිසා පිරිසිදු රෙදි කඩක් හෝ ගෝස් පෑඩ කිහිපයක් ගෙන විවෘත වූ අස්ථිය මත තබා හොඳින් ආවරණය කරමින් රුධිර වහනය පාලනය කළ යුතුයි.

### 4. රෝගියාට පහසු පරිදි වාඩි හෝ හාන්සි කරවන්න.



අස්ථි භග්නයක් ඇතිවිට තුවාලකරුට ක්ලාන්තය සෑදීම, අසිහි තත්ත්වයට පත්වීම වැනි දෑ මෙන්ම වේදනාව අධිකවීම ද දක්නට ලැබෙනවා. එම නිසා තුවාලකරුට තවමත් වාඩි කරවීම හෝ හාන්සි කරවීම සිදු නොකළේ නම් සුදුසු පරිදි එය කළ යුතු වනවා.





## 5. 1990 හෝ වෙනත් හදිසි ඇමතුම් අංක මගින් ගිලන් රථයකට හෝ වෙනත් රථයකට අමතන්න

බස්නාහිර හා දකුණු පළාත්වල නම් 1990 ඇමතීමෙන් හදිසි ගිලන් රථ ලබාගන්න පුළුවන්. අනෙකුත් ප්‍රදේශවල වෙනත් ගිලන් රථවලට මෙන්ම වෙනත් සුදුසු රථවාහනයකට ඇමතීමෙන් රෝගී ප්‍රවාහනය සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරගත යුතු වෙනවා.

## 6. ආධාරක හා මෘදු පෑඩ තබන්න

භග්න වූ අවයවයේ සෙලවීම අවම කිරීමටත්, වේදනාව අවම කොට තුවාලකරුට පහසුව ඇති




කිරීමටත් භග්න වූ අවයවයට යටින් හා දෙපසින් වන පරිදි මෘදු පෑඩයක් (තුවායක්, සැහැල්ලු ඝනකම සහිත රෙදි කඩක්, ගෝස් අතුරනයක්) තබන්න.

## 7. උරමා හා වෙළුම්පටි යොදා ක්‍රමවත්ව නිශ්චල කරන්න


තුවාලකරු දැන් රෝහලක් වෙත රැගෙන යාමට නම් රෝගියා ප්‍රවාහනයේදී සිදු වන සෙලවීම් අවම කිරීමට මනාව නිශ්චල කරගත යුතු වෙනවා. ඉහළ බාහුවක භග්නයක් නම් බොහෝ විට උරමාවක් යෙදීමත්, උකුළේ සිට පහළ ප්‍රදේශයේ නම් ආධාරක මෙන්ම අනතුරු නොවූ පාදය එකට තබා වෙළුම් පටි යෙදීමෙනුත් භග්නය නිශ්චල කරගන්න පුළුවන්. එය සිදු කරන්නේ කෙසේදැයි බලමු.

### අතෙහි හෝ ඇඟිලිවල භග්නයක් ඇති විට මහ උරමාව යොදන ආකාරය


| පියවර 1 | පියවර 2 | පියවර 3 | පියවර 4 |
|---|---|---|---|
|  |   |  |  |
| භග්නය වූ අතට යටින් මෘදු පෑඩය තබා එම අතෙහි වැලිමිට ප්‍රදේශයට ත්‍රිකෝණ වෙළුම් පටියේ ශීර්ෂය යොමුවන පරිදි අත යටින් වෙළුම් පටිය එළා ගන්න. | දැන් වෙළුම් පටියේ කොන් දෙක එකට ගෙන භග්න වූ අත පැත්තේ උරහිස මතට පිරිමි ගැටය යොදන්න. එවිට නැවූ අත ඉංග්‍රීසි එල් අකුරේ හැඩයට තබා ගැනීම සුදුසුයි. | වෙළුම යොදා භග්න වූ අතෙහි ඇඟිලි තෙක් වැසෙන සේ සකසා වෙළුම් පටියෙහි ශීර්ෂය රූපයේ දැක්වෙන පරිදි රඳවන්න. | වැඩි දුරක් රෝගියා ප්‍රවාහනය කළ යුතු නම් තවත් පළල් වෙළුම් පටියක් යොදා රූපයේ පරිදි නිශ්චල කරන්න. උමරවා රුධිර සංසරණයට බාධා වී ඇත්නම් එය මොහොතකට ලිහිල් කොට තබන්න. රෝහල්ගත කරන්න. |



### උකුළේ හෝ පාදයෙහි භග්නයක් ඇති විට නිශ්චල කරන ආකාරය

| පියවර 1 | පියවර 2 | පියවර 3 | පියවර 4 |
|---|---|---|---|
|  |  |  |   |
| ආධාරකයක් තබා භග්න වූ පාදය නිශ්චල කරන්න | දෙපා මැදට දණහිස සංධියේ සිට වළලුකර සන්ධිය දක්වා විහිදෙන පරිදි තුවායක් හෝ රෙදිකඩක් මැනවින් තබා පාද දෙක එකට තැබෙන සේ වෙළුම් පටියකින් අටහැඩ ගැටය යොදන්න. | භග්න වූ ස්ථානයට ඉහළින් ඇති සන්ධියට පාද දෙක් එකට තබා වෙළුමක් යොදන්න. | ඒ අනුව රූපයේ පරිදි අටහැඩ ගැටය, භග්න වූ තැනට ඉහළින් හා පහළින් තිබෙන සන්ධිය, භග්නයට දෙපසින් ආදී වශයෙන් වූ ස්ථානවලට රූප සටහනේ පරිදි පළල් වෙළුම් පටි යොදන්න. |

## 8. රෝහලක් වෙත රැගෙන යන්න








භග්නය හොඳින් නිශ්චල කළ පසු රෝගියාව ආරක්ෂිතව සුදුසුම ප්‍රවාහන ක්‍රමයකින් ප්‍රවාහනය කළ යුතු වෙනවා. මෙහිදී විශේෂයෙන් භග්න වූ අවයව ප්‍රදේශය නොසෙල්වන පරිදි රැගෙන යාම ඉතාම වැදගත්. එමෙන්ම ත්‍රීරෝද රථයකින් හෝ යතුරුපැදියකින් එවන් රෝගියෙකු ප්‍රවාහනය කළහොත් තත්ත්වය උත්සන්න වීමට ඇති හැකියාව වැඩි නිසා හැකි සෑම විටම ගිලන් රථයක් හෝ හොඳින් ඉඩකඩ තිබෙන රථයකින් එය කළ යුතු වෙනවා. එවන් රථයක් දක්වා රෝගියාව ප්‍රවාහනය කිරීමට පහත දැක්වෙන පරිදි වූ ප්‍රවාහන ක්‍රමයක් භාවිතා කරන්න පුළුවන්.

ඒ වගේම රෝහලේදී අවශ්‍ය ශල්‍යකර්ම වැනි කටයුතු පහසු වීම සඳහාත්, රෝගියාට සිහිය නැතිවුවහොත් වමනය සිදුවී එමගින් ස්වසනය අවහිර වීම වළක්වා ගැනීම සඳහාත් රෝගියාට ආහාරපාන දීම සුදුසු නැහැ.

කොඳු ඇටපෙළෙහි හානියක් ඇති වූ විට කළ යුතු ප්‍රථමාධාර පිළිබඳව අපි ඊළඟ පාඩමෙන් සාකච්ඡා කරමු.

ඉහත ප්‍රථමාධාර ක්‍රමශිල්ප එදිනෙදා ප්‍රායෝගිකව භාවිතා කිරීම සඳහා විධිමත් ප්‍රථමාධාර පුහුණුවකට සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර මෙම තොරතුරු කියවීම පමණක් ප්‍රථමාධාර ලබාදීමට ප්‍රමාණවත් හැකියාවක්, දැනුමක් හා විශ්වාසයක් ලබා නොදෙයි. ජීවිතයට අතිශය වැදගත් මෙවැනි ප්‍රථමාධාර ක්‍රම ශිල්ප පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඔබට ලබා ගත හැක. ඒ පිළිබඳ තොරතුරු සඳහා www.redcross.lk වෙත පිවිසෙන්න. කතා කරන්න 0115347000.

## පසුගියදා ඇතිවුන ආපදා තත්වයේදී
## ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ මානුෂීය මෙහෙවර


කොළඹ


කොළඹ


රත්නපුර


ගම්පහ


කළුතර


කළුතර


ගාල්ල


ගාල්ල


මාතර


මාතර



# ශ්‍රී ලංකා චීන වසර 60 ක මිත්‍රත්වය සැමරීම සඳහා සංවිධානය කරන රචනා තරගය

## මාතෘකාව : එදා මෙදා තුර ශ්‍රී ලංකා චීන මිතුදම

**ජ්‍යෙෂ්ඨ අංශය (11,12,13 ශ්‍රේණිවල පාසල් සිසුන් සඳහා )**

ප්‍රථම ත්‍යාගය - රු 15,000/-
දෙවන ත්‍යාගය - රු. 10,000/-
තෙවන ත්‍යාගය - රු. 5,000/-
හතරවන ස්ථානයේ සිට දසවන ස්ථානය දක්වා - රු. 1000/-

**රචනාව වචන 750 වඩා වැඩි විය යුතුය**

**කණිෂ්ඨ අංශය (6,7,8, 9 සහ 10 ශ්‍රේණිවල පාසල් සිසුන් සඳහා)**

ප්‍රථම ත්‍යාගය රු 10,000/-
දෙවන ත්‍යාගය රු. 7,000/-
තෙවන ත්‍යාගය රු. 3,500/-
හතරවන ස්ථානයේ සිට දසවන ස්ථානය දක්වා රු. 1000/-

**රචනාව වචන 500 වඩා වැඩි විය යුතුය**

ඔබගේ රචනාව පහත සඳහන් කූපනය පුරවා පන්ති භාර ගුරුතුමා මගින් විදුහල්පති තුමා/ දහම් පාසල් ප්‍රධානාචාර්ය තුමාගේ අත්සනින් සහතික කර කවරයේ වම් කෙලවරේ තමාට අයත් කාණ්ඩය සඳහන් කොට 2017 සැප්තැම්බර් 19 දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය, නො 59 A , ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.

සම්පූර්ණ නම : ..................................................
ශ්‍රේණිය : ..................................................
අයත් කාණ්ඩය : ..................................................
පාසල/දහම් පාසල : ..................................................
නිවසේ ලිපිනය : ..................................................
දුරකතන අංකය : ..................................................

සහතික කිරීම

..................................................
පන්තිභාර ගුරුතුමියගේ අත්සන

..................................................
විදුහල්පති තුමා/ දහම් පාසල් ප්‍රධානාචාර්ය තුමාගේ අත්සන

# සුභාසර පාඨක සාමාජිකයෝ



සාමාජික අං : 83
**ධනුෂ්ක ද සිල්වා**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 84
**තුමිදු වන්ශනාථ**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ




සාමාජික අං : 85
**පුබුදු හෙන්දෙනිය**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 86
**කෙවන් කොඩිතුවක්කු**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 87
**ටිටාන් ඒකනායක**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 88
**රනුල් රත්නින්ද**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 89
**මාධව දිසානායක**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 90
**හර්ෂ කෞෂල්‍ය**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 91
**එන්. එච්. බී. දසනායක**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 92
**චාරුක හත්තොටුවේගම**
ශාන්ත තෝමස් විදුහල
මාතලේ



සාමාජික අං : 93
**දිලීෂ මඩුගල්ලේ**
ඩී.එස්. සේනානායක විදුහල
කොළඹ



සාමාජික අං : 94
**ඕෂධි මඩුගල්ලේ**
දේවි බාලිකා විදුහල
කොළඹ

---

## සුභාසර පාඨක සාමාජිකත්වය

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව ත්‍රෛයි මාසිකව නිකුත් කරනු ලබන සුභාසර සඟරාවේ පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත විස්තර පුරවා මෑතකදී ගත් 2.5 x 3.5 cm ප්‍රමානයේ ඡායාරූපයක් සමග අපගේ ලිපිනය වෙත යොමු කරන්න.

නම : ..............................................................................................

ලිපිනය : ..............................................................................................

වයස : ........................................ පාසල : ........................................................

දුරකථන : ........................................ විද්‍යුත් ලිපිනය : ........................................

ප්‍රශ්නය : මෙවර සුභාසර කලාපයේ ඔබ වඩාත් කැමති ලිපිය කුමක්ද?

පිළිතුර : ..............................................................................................

අපගේ ලිපිනය : 4/91A, 5 වන පටුමග, තලකොටුව වත්ත, පොල්හේන්ගොඩ, කොළඹ 05. P. O Box : 1774




| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 05.00-10.00 (Eng) | 10.00-00.00 (Sin) |
| Short wave | 7260/9490/7265/11900 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ටින් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැඳීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中国国际广播电台

CHINA RADIO INTERNATIONAL


**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,

Beijing, P.R. China

Post code:100040

Tel: 00 86 10 6889 2373/0439

Fax: 00 86 10 68892361

Email: sinhalacri@gmail.com

Web: http://sinhalese.cri.cn/

Facebook: Cheena Sinhala handa

Twitter: Voice of China-Lanka